19.2.4 ශාරීරික අධ්‍යාපන අංශයේ කණ්ඩායම් ව්‍යූහය



19.2.5 ආරාධිත උපදේශකවරු

පහත සඳහන් උපදේශකවරුන්ගේ සේවය මෙම අංශය සඳහා ලබා ගන්නා ලද අතර ඔවුන් විසින් තරග විනිශ්චය කටයුතු මෙහෙයවන ලදී.
2020 වර්ෂය තුළ දී මෙම අංශය විසින් බඳවා ගන්නා ලද ආරාධිත උපදේශකවරුන්ගේ සංඛ්‍යාව දහයකි (10). ඔවුන් විසින් පහත සඳහන් තරග ඉසව් සඳහා සක්‍රීය දායකත්වය සැපයිණි.

අංකය	තරග ඉසව්ව	නම	සුදුසුකම්
01	බැඩ්මින්ටන්	ඩබ් ඒ ඩී පී සී විජේතුංග මයා	විශ්වවිද්‍යාල වර්ණලාභී
02	කැරම්	බී ඩී ආර් කුමාර මයා	කැරම් ජාතික ශූරතාව
03	එල්ලේ	ආර් ඒ කේ ධනසිරි මයා	ඒ ශ්‍රේණියේ පුහුණුකරු
04	කරාතේ	එල් ආර් අර් ජේ හේරත් මයා	ජාත්‍යන්තර කළු පටි ශූර
05	රගර්	බී එම් බී ඩී බණ්ඩාර මයා	සුදුසුකම්ලත් දෙවන පෙළ රගර් පුහුණුකරු
06	පිහිණුම්	එන් එම් ජේ කේ නවරත්න මයා	ශිල්පශාලිකාහි පිහිණුම් පුහුණුකරු
07	මේස පන්දු	ටී එම් කේ පී බී තෙන්නකෝන් මයා	ක්‍රීඩා නිලධාරී
08	ටයිකුණ්ඩූ	එස් ඒ යූ එස් ප්‍රනාන්දු මයා	ජාතික ක්‍රීඩක හා නිර්දේශක
09	බර ඉසිලීම	ආර් පී එම් එස් විජේරත්න මයා	ජාතික මට්ටමේ තරඟකරු හා විනිසුරු
10	මල්ලව පොර	කේ පී ඩී ප්‍රියන්ත මයා	ජාතික ක්‍රීඩා උළෙලේ ජයග්‍රාහක

19.2.6 වාර්ෂික වැඩසටහන්

ශාරීරික අධ්‍යාපන අංශය මගින් වාර්ෂිකව පහත සඳහන් තරඟ ඉසව් සංවිධානය කරනු ලැබේ. නමුත් 2020 වර්ෂයේ ඇති වූ කොවිඩ් 19 තත්වය හේතුවෙන් මෙම තරග ඉසව් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ නොපවත්වන ලදී.

01. අන්තර් පීඨ නවක ශූරතාව
02. අන්තර් පීඨ ශූරතාව
03. අන්තර් විශ්වවිද්‍යාලයීය ශූරතාව
04. විනෝදාත්මක වැඩසටහන්
05. ශාරීරික යෝග්‍යතා වැඩසටහන්

එසේම ජාතික සහ ජාත්‍යන්තර වැඩසටහන් ඉහත හේතු මත කල් දමන ලදී.

19.2.7 අනෙකුත් තරග ඉසව්

සලකා බලන වර්ෂය තුළ අපගේ ශිෂ්‍යයන් පහත සඳහන් බාහිර තරග ඉසව් සඳහා සහභාගී වී ඇති අතර එමඟින් ඔවුන්ගේ අත්දැකීම් සහ හැකියාවන් වර්ධනය කර ගැනීමට සමත් වී ඇත.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ බැඩ්මින්ටන් ශූරතාව 2020
- රජරට විශ්වවිද්‍යාලයේ හොකී තරඟාවලිය 2020
- මොරටුව විශ්වවිද්‍යාලයේ ක්‍රිකට් තරඟාවලිය 2020
- මලින්ද අරුමාදුර අනුස්මරණ බේස් බෝල් ශූරතාව 2020

- පළමු මාර්ගගත කොරියානු තානාපති කුසලාන ටයිකොන්ඩෝ ශූරතාව 2020 (ශ්‍රී ලංකාවේ කොරියානු තානාපති කාර්යාලය සහ ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනය මගින් සංවිධානය කරන ලදී)

19.2.8 ජයග්‍රහණ

- ජී ඒ සී එස් ඩබ් ආරච්චි (179009) 2020 ලෝක රට හරහා දිවීම ශූරතාව සඳහා තේරීම් තරඟ වටවලට සහභාගී වූ අතර ඔහු ජාතික විශ්වවිද්‍යාල රට හරහා දිවීමේ කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස තේරී පත් විය.
- ජී සී තිලාන් (179144) ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල පැසි පන්දු කණ්ඩායම පිරිමි 2020 සඳහා තේරී පත් වූ අතර ජ්‍යේෂ්ඨ ජාතික පැසිපන්දු ශූරතාව 2020 නියෝජනය කළේය. මෙය ශ්‍රී ලංකා පැසි පන්දු සම්මේලනය විසින් සංවිධානය කරන ලදී.

19.2.9 වර්ණ ප්‍රදාන උත්සවය

දීර්ඝ කාලයක් තුළ අපේක්ෂාවෙන් සිටි 2020 වර්ණ ප්‍රදානෝත්සවය වයඹ විශ්වවිද්‍යාලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හදවත් තුළ බලාපොරොත්තු මල්ඵල ගන්වමින් උත්කර්ශවත් අන්දමින් 2020 පෙබරවාරි මස 17 වන දින ප්‍රධාන ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ඊ එම් පී ඒකනායක මහතාය. එහි දී වර්ණ ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් අගය කිරීමත් ඔවුන්ගේ අනාගත සාර්ථකත්වය සඳහා සුබ පැතීමත් උපකුලපති තුමා විසින් සිදු කරන ලදී. මෙම උත්සවය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා සංගමය සහ ශාරීරික අධ්‍යාපන අංශය මගින් සංවිධානය කරන ලදී.

19.2.10 හඳුන්වාදීමේ වැඩසටහන්

ශාරීරික අධ්‍යාපන අංශයේ කාර්යභාරය හඳුන්වා දීම සඳහාත් අපගේ දැක්ම සහ මෙහෙවර අර්ථකථනය කිරීම සඳහාත් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ජීවිතය තුළ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැලීමේ හැකියාව සහ අවශ්‍යතාවත් එහි ප්‍රතිලාභ සහ ප්‍රවණතා පිළිබඳවත් දැනුවත් කිරීම උදෙසා නවක සිසුන් වෙනුවෙන් හඳුන්වා දීමේ වැඩසටහන් පීඨ මට්ටමින් සංවිධානය කෙරිණි.

19.2.11 යෝජනා

- විශ්වවිද්‍යාලයේ අන්තර් පීඨ ශූරතාව සහ අන්තර් පීඨ නවක ශූරතාව සෑම වසරකම සියලු පීඨයන්හි අධ්‍යයන වර්ෂය තුළ මැයි සහ ජූලි මාසවල දී පැවැත්වීම සඳහා කටයුතු කළ යුතු බවට යෝජනා කෙරේ.
- සියලු පීඨයන්හී අධ්‍යයන කටයුතු එක අවස්ථාවක ආරම්භ කිරීම සුදුසුය.
- අවම වශයෙන් සවස 4.30න් පසු සිසුන් අධ්‍යයන කටයුතුවලින් මුදා හැරීම
- අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් සිසුන් ක්‍රීඩා කටයුතු කිරීම සඳහා සම්බන්ධ වීමේ වැදගත්කම දිරිගැන්වීමේ මට්ටම ඉහළ දැමීම.

- විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් සිසුන් ශාරීරික අධ්‍යාපන වැඩසටහන්වලට සහභාගී වන විට දේශනවලින් නිදහස් කිරීම

19.2.12 මූල්‍ය ප්‍රකාශය

විස්තරය		ප්‍රමාණය (රු)
ක්‍රීඩා උපකරණ		2,548,630.00
වෙන් කිරීම්		40,000.00
වර්ණ ප්‍රදානෝත්සවය		227,000.00
සුළු මුදල්		51,035.00
ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා සංගමයේ දායක මුදල්		150,000.00
ආරාධිත උපදේශක ගෙවීම්		10,500.00
බාහිර තරඟ	විශ්වවිද්‍යාල මට්ටම	46,340.00
	ජාතික මට්ටම	28,405.00
කාර්යාලයීය උපකරණ		161,320.00
ක්‍රීඩා ජාතික සංගමයේ ගාස්තු		1,500.00
සහතික පත්‍ර		27,500.00
මුළු වාර්ෂික වියදම		**3,292,230.00**











19.3 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

19.3.1 හැඳින්වීම

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 2003 ජනවාරි මස ස්ථාපනය කරන ලද්දකි. මෙය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මඟපෙන්වීම යටතේ පිහිටුවන ලද අතර විශ්වවිද්‍යාල සිසුන්ගේ වෘත්තීය හා මෘදු කුසලතා ඉහළ නැංවීමේ අභිලාසයෙන් පිහිටුවන ලදී. ඒ අනුව විශ්වවිද්‍යාලයීය සිසුන් හා ආයතන අතර යම් සබඳතාවක් මේ හරහා ගොඩ නැඟෙයි. ආරම්භයේ සිට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් ඉහත පරමාර්ථය පදනම් කොටගත් නොයෙකුත් අවස්ථාවන් සංවිධානය කරනු ලැබ ඇත. මෙම අංශය උපකුලපති තුමා යටතේ සෘජුව පාලනය වෙයි.

තම අධ්‍යයන පසුබිමේ සිට වෘත්තීය ඉලක්කයන් කරා යොමුවීමට සිසුන්ට සාර්ථක දිරිගැන්වීමක් වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් සිදු කෙරේ. මේ අනුව වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සමබර අන්දමින් සෘජු සේවා, අධ්‍යාපන වැඩසටහන් සහ සම්පත් ද්‍රව්‍ය ආදිය සැපයීම සිදු කොට ඇත.

ඒ අනුව ශිෂ්‍යයන්ට

- අර්ථවත් රැකියා සොයාගැනීමට උපකාරී වීම
- පුහුණුව සඳහා ආයතන සොයාගැනීම
- ඔවුන්ගේ වෘත්තීය අභිලාශයන්ට සරිලන පරිදි අමතර අධ්‍යාපන සුදුසුකම් ලබාගැනීමට උපකාරී වීම

යන පහසුව ලැබෙයි. ව්‍යාපෘති සඳහා සහභාගී වීමට සිදුවන උපාධි අපේක්ෂකයනට මෘදු කුසලතා පිළිබඳ වැඩමුළු සහ සම්මන්ත්‍රණ, ව්‍යවසායකත්ව සහ අනෙකුත් ක්ෂේත්‍රයන්හි පුද්ගල සංවර්ධන වැඩසටහන් ප්‍රයෝජනවත් වෙයි.

වෙළඳ ලෝකයේ පැවැත්ම සඳහා ඔවුන්ට මේවා අතිශයින්ම වැදගත් වෙයි. මෙම වැඩසටහන් සඳහා සහභාගි වන සිසුන් පමණක් පෞද්ගලික සම්මුඛ පරීක්ෂණ ස්වාභාවයෙන් පවත්වනු ලබන වෘත්තීය වෙළඳපොළ (පෞද්ගලික ආයතන සහ සිසුන්ගේ සහභාගීත්වයෙන් සිදු කෙරෙන) සඳහා සහභාගිවීමට සුදුසුකම් ලබති.

19.3.2 දැක්ම

යාවජීව අධ්‍යාපනය, ආර්ථික සමෘද්ධිමත්භාවය, මානසික ස්ථාවරත්වය සහ සමාජ සංචලනය සහ අවසන් ඉලක්කය කරා මෙහෙය වන සංකීර්ණ කාර්යමය ලෝකයේ ප්‍රශස්ත වෘත්තීය අවස්ථා ලඟාකර දෙන තත්වයෙන් උසස් සහ අත්‍යවශ්‍ය වෘත්තීය සහ මෘදු කුසලතාවලින් සමන්විත උපාධිධාරීන් පිරිසක් ලෙස දැනුවත්භාවය ඇතිකිරීම සහ සවිබල ගැන්වීම.

19.3.3 මෙහෙවර


වෘත්තීය හා මෘදු කුසලතා වර්ධනය කරගැනීමට උපකාරී වන වැඩසටහන් මෙන්ම ආයතනික සම්බන්ධතාව වර්ධනය කිරීම මගින් සිසුන් තත්වයෙන් උසස් වෘත්තිකයන් බවට පත්කරලීමෙන් උද්යෝගී ගෝලීය පුරවැසියන් වීමට අවස්ථාව අපි සලසා දෙන්නෙමු.

19.3.4 පරමාර්ථ

- වෘත්තීය සංවර්ධනය වෙනුවෙන් සම්මන්ත්‍රණ, වැඩමුළු, දේශන සහ පුහුණුවීම් වැනි විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.
- සිසුන්ට ගැලපෙන හා තාත්වික වෘත්තීන් තෝරාගැනීමට සහ වෘත්තීය මග පෙන්වීමට සහාය වීම
- අධ්‍යාපනික සංවර්ධනය උදෙසා දායක වීමට තරුණයින් පෙළඹවීම
- සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන ගමන් මග සාර්ථක කර ගැනීම සඳහා ඔවුන්ගේ කෙටි කාලීන හා දිගු කාලීන අරමුණු පෙළගැස්වීමට මග පෙන්වීම.
- අන්තර්ජාලය හරහා වෘත්තීය පුහුණු අවස්ථා හා රැකියා අවස්ථා පිළිබඳ දත්ත ගබඩාවක් ඇති කිරීම.
- ශිෂ්‍යත්ව / පුහුණු වැඩසටහන්, රැකියා සහ ඉගෙන ගැනීමේ අවස්ථා පිළිබඳ කළමනාකරණය කිරීම සහ තොරතුරු ලබාදීම.
- සම්මුඛ පරීක්ෂණ සඳහා සූදානම් වීමට ජීව දත්ත සකස් කිරීමට සහ සිසුන්ගේ සන්නිවේදන කුසලතා වැඩිදියුණු කර ගැනීමට උදව් වීම.

ඉහත පරමාර්ථ ලඟාකර ගැනීම සඳහා සිසුන් හට වැඩි වැඩියෙන් අවස්ථාවන් උදාකරදීම සහ වෘත්තීය මාර්ගෝපදේශණ වැඩසටහන් මගින් ආයතනයන් සමග සෘජු සම්බන්ධතා ඇති කරලීම සිදු කෙරේ. මෙම පරමාර්ථ ලඟාකරගැනීමෙන් පසු සිසුන්ට ගෝලීය ආයතනික සහ දේශීය ආයතනික ව්‍යූහය පිළිබඳ අවබෝධයක් පෞද්ගලික හා රාජ්‍ය අංශ කෙරෙහි ලබා ගත හැකි වනු ඇත.

19.3.5 අපගේ සංවිධාන ව්‍යූහය



19.3.6 කාර්ය මණ්ඩලය

තනතුර	නම
අධ්‍යක්ෂ - වෘත්තීය මාර්ගෝපදේශන කළමනාකරණ සහකාර	ආචාර්ය එච් එම් ඒ හේරත් මහතා එන් පී එස් ජනකසිරි මහතා

මීට අමතරව ඒ ඒ පීඨ මට්ටමින් පීඨ සම්බන්ධීකාරකවරු පත් කොට ඇත.

සම්බන්ධීකාරගේ නම	පීඨය
ආචාර්ය ඩබ් එම් ඩබ් ඩබ් කන්දේගම මයා	කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
ආචාර්ය ඒ ධර්මවංශ මයා	ව්‍යවහාරිකවිද්‍යා පීඨය
ආචාර්ය ඩබ් එස් සංජීව මයා	ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය
ආචාර්ය ශාමලී පීරිස් මෙය	පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය
ආචාර්ය උප්නීත් ලියනාරච්චි මයා	තාක්ෂණ පීඨය
වෛද්‍ය ඊ ඩී එම් පී ඒකනායක මිය	වෛද්‍ය පීඨය

19.3.7 2020 වර්ෂයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මඟින් සංවිධානය කරන ලද පුහුණු / දැනුවත් කිරීමේ වැඩමුළු

1. වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන තාක්ෂණ පීඨය

සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය – ආචාර්ය එච් එම් ඒ හේරත් මහතා, අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

දිනය	2020 ජනවාරි 21
ඉලක්ක ක්ෂේත්‍රය	පාසලෙන් විශ්වවිද්‍යාලයට පරිවර්තනය වීමට හුරු කරවීම
ඉලක්ක කණ්ඩායම	තාක්ෂණ පීඨයේ ප්‍රථම වසර සිසුන්
සහභාගි වූ පිරිස	107
ස්ථානය	කුලියාපිටිය පරිශ්‍රය

2. තේ රස බැලීමේ වැඩමුළුව් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය – උපාලි ප්‍රේමලාල් මහතා, උපදේශක Finlays Company Pvt Ltd

දිනය	2020 ජනවාරි 24
ඉලක්ක ක්ෂේත්‍රය	සේවා නියුක්ත කුසලතා වර්ධනය
ඉලක්ක කණ්ඩායම	කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨ තෙවන වසර සිසුන්
සහභාගි වූ පිරිස	24
ස්ථානය	මාකඳුර පරිශ්‍රය

3. නායකත්ව සංවර්ධන වැඩසටහන - තාක්ෂණ පීඨය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය – ආචාර්ය එච් එම් ඒ හේරත් මහතා, අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
ධම්මික වර්ණසූරිය මහතා මානව සම්පත් කළමනාකරු, MAS Slimtex

දිනය	2020 ජනවාරි 28
ඉලක්ක ක්ෂේත්‍රය	සේවා නියුක්ත කුසලතා වර්ධනය
ඉලක්ක කණ්ඩායම	තාක්ෂණ පීඨයේ පළමු වසර සිසුන්
සහභාගි වූ පිරිස	250
ස්ථානය	කුලියාපිටිය පරිශ්‍රය

4. නායකත්ව සංවර්ධන වැඩසටහන - තාක්ෂණ පීඨය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය – ආචාර්ය එච් එම් ඒ හේරත් මහතා, අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
ගාමිණී ජයසූරිය වෘත්තීය මාර්ගෝපදේශක මහතා

දිනය	2020 ජනවාරි 29
ඉලක්ක ක්ෂේත්‍රය	සේවා නියුක්ත කුසලතා වර්ධනය
ඉලක්ක කණ්ඩායම	ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස	80
ස්ථානය	කුලියාපිටිය පරිශ්‍රය

5. දෙදින භාහිර පුහුණු වැඩසටහන (පළමු වැඩසටහන) - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය – COCO Garden, මූණමල්දෙණිය, කුලියාපිටිය

දිනය	2020 ජනවාරි 30, 31 දින
ඉලක්ක ක්ෂේත්‍රය	සේවා නියුක්ත කුසලතා වර්ධනය
ඉලක්ක කණ්ඩායම	ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස	92
ස්ථානය	COCO Garden, මූණමල්දෙණිය, කුලියාපිටිය

6. දෙදින භාහිර පුහුණු වැඩසටහන (දෙවන වැඩසටහන) - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය – COCO Garden, මූණමල්දෙණිය, කුලියාපිටිය

දිනය	2020 පෙබරවාරි 10, 11 දින
ඉලක්ක ක්ෂේත්‍රය	සේවා නියුක්ත කුසලතා වර්ධනය
ඉලක්ක කණ්ඩායම	ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස	94
ස්ථානය	COCO Garden, මූණමල්දෙණිය, කුලියාපිටිය

7. රැකියා අයදුම්පත සැකසීම - ව්‍යවහාරිකවිද්‍යා පීඨය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය – ගාමිණී ජයසූරිය මහතා වෘත්තීය මාර්ගෝපදේශක

දිනය	2020 පෙබරවාරි 12
ඉලක්ක ක්ෂේත්‍රය	සේවා නියුක්ත කුසලතා වර්ධනය
ඉලක්ක කණ්ඩායම	සිව්වන වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස	66
ස්ථානය	කුලියාපිටිය පරිශ්‍රය

8. දෙදින භාහිර පුහුණු වැඩසටහන (තෙවන වැඩසටහන) - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය – COCO Garden, මූණමල්දෙණිය, කුලියාපිටිය

දිනය	2020 පෙබරවාරි 13, 14 දින
ඉලක්ක ක්ෂේත්‍රය	සේවා නියුක්ත කුසලතා වර්ධනය
ඉලක්ක කණ්ඩායම	සිව්වන වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස	95
ස්ථානය	COCO Garden, මූණමල්දෙණිය, කුලියාපිටිය

9. දෙදින භාහිර පුහුණු වැඩසටහන (සිව්වන වැඩසටහන) - ව්‍යවහාරිකවිද්‍යා පීඨය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය – COCO Garden, මූණමල්දෙණිය, කුලියාපිටිය

දිනය	2020 පෙබරවාරි 24, 25 දින
ඉලක්ක ක්ෂේත්‍රය	සේවා නියුක්ත කුසලතා වර්ධනය
ඉලක්ක කණ්ඩායම	ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස	85
ස්ථානය	COCO Garden, මූණමල්දෙණිය, කුලියාපිටිය

10. දෙදින භාහිර පුහුණු වැඩසටහන (පස්වන වැඩසටහන) - තාක්ෂණ පීඨය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය – COCO Garden, මූණමල්දෙණිය, කුලියාපිටිය

දිනය	2020 පෙබරවාරි 27, 28 දින
ඉලක්ක ක්ෂේත්‍රය	සේවා නියුක්ත කුසලතා වර්ධනය
ඉලක්ක කණ්ඩායම	ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස	83
ස්ථානය	COCO Garden, මූණමල්දෙණිය, කුලියාපිටිය

11. වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන ව්‍යවහාරිකවිද්‍යා පීඨය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය - ආචාර්ය එච් එම් ඒ හේරත් මහතා, අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

දිනය	2020 මාර්තු 05
ඉලක්ක ක්ෂේත්‍රය	පාසලෙන් විශ්වවිද්‍යාලයට පරිවර්තනය වීමට හුරු කරවීම
ඉලක්ක කණ්ඩායම	ප්‍රථම වසර උපාධි අපේක්ෂකයින්
සහභාගි වූ පිරිස	114
ස්ථානය	කුලියාපිටිය පරිශ්‍රය

12. වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය - ආචාර්ය එච් එම් ඒ හේරත් මහතා, අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

දිනය	2020 සැප්තම්බර් 23
ඉලක්ක ක්ෂේත්‍රය	පාසලෙන් විශ්වවිද්‍යාලයට පරිවර්තනය වීමට හුරු කරවීම
ඉලක්ක කණ්ඩායම	ප්‍රථම වසර උපාධි අපේක්ෂකයින්
සහභාගි වූ පිරිස	240
ස්ථානය	මාකඳුර පරිශ්‍රය

13. තේ රස බැලීමේ වැඩමුළුව - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය – උපාලි ප්‍රේමලාල් මහතා, උපදේශක Finlays Company Pvt Ltd

දිනය	2020 ඔක්තෝබර් 03
ඉලක්ක ක්ෂේත්‍රය	සේවා නියුක්ත කුසලතා වර්ධනය
ඉලක්ක කණ්ඩායම	තෙවන වසර සිසුන්
සහභාගි වූ පිරිස	40
ස්ථානය	මාකඳුර පරිශ්‍රය

14. විධායක කමිටු රැස්වීම 01 - GEVEL Club වයඹ විශ්වවිද්‍යාලය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය GEVEL Club කුලියාපිටිය

දිනය	2020 නොවැම්බර් 05
ඉලක්ක ක්ෂේත්‍රය	සේවා නියුක්ත කුසලතා වර්ධනය
ඉලක්ක කණ්ඩායම	GEVEL Club හි විධායක කමිටු සාමාජිකයින්
සහභාගි වූ පිරිස	08
ස්ථානය	කුලියාපිටිය පරිශ්‍රය (ZOOM තාක්ෂණය ඔස්සේ)

15. විධායක කමිටු රැස්වීම 02 - GEVEL Club වයඹ විශ්වවිද්‍යාලය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය GEVEL Club කුලියාපිටිය

දිනය	2020 නොවැම්බර් 15
ඉලක්ක ක්ෂේත්‍රය	සේවා නියුක්ත කුසලතා වර්ධනය
ඉලක්ක කණ්ඩායම	GEVEL Club හි විධායක කමිටු සාමාජිකයින්
සහභාගි වූ පිරිස	08
ස්ථානය	කුලියාපිටිය පරිශ්‍රය (ZOOM තාක්ෂණය ඔස්සේ)

16. වෘත්තීය සංවර්ධනය සහ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳ වැඩමුළුව-කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය ප්‍රසන්න ආරියරත්න මහතා, මෙහෙයුම් කළමනාකරු (තත්ව පරීක්ෂණ), UNICEF
ආචාර්ය ඩබ්. එම්. ඩබ්. ඩබ්. කන්දේගම මහතා, වෘත්තීය මාර්ගෝපදේශන සම්බන්ධීකාරක කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

දිනය	2020 නොවැම්බර් 18 දින
ඉලක්ක ක්ෂේත්‍රය	සේවා නියුක්ත කුසලතා සංවර්ධනය
ඉලක්ක කණ්ඩායම	සිව්වන වසර සිසුන්
සහභාගි වූ පිරිස	80
ස්ථානය	මාකඳුර පරිශ්‍රය (ZOOM තාක්ෂණය ඔස්සේ)

17. GEVEL Club(පළමු රැස්වීම) වයඹ විශ්වවිද්‍යාලය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය GEVEL Club කුලියාපිටිය

දිනය	2020 නොවැම්බර් 22
ඉලක්ක ක්ෂේත්‍රය	සේවා නියුක්ත කුසලතා වර්ධනය
ඉලක්ක කණ්ඩායම	GEVEL Club හි සියලු සාමාජිකයින්
සහභාගි වූ පිරිස	120
ස්ථානය	කුලියාපිටිය පරිශ්‍රය (ZOOM තාක්ෂණය ඔස්සේ)

18. වෘත්තීය සැලසුම් කිරීම සහ පෞද්ගලික ඉලක්ක ලඟා කරගැනීම වැඩමුළුව කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය ආචාර්ය ඩබ්. එම්. ඩබ්. ඩබ්. කන්දේගම මහතා, වෘත්තීය මාර්ගෝපදේශන සම්බන්ධීකාරක කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

දිනය	2019 දෙසැම්බර් 02 දින
ඉලක්ක ක්ෂේත්‍රය	පාසලෙන් විශ්වවිද්‍යාලයට පරිවර්තනය වීමට හුරු කරවීම
ඉලක්ක කණ්ඩායම	ප්‍රථම වසර උපාධි අපේක්ෂකයින්
සහභාගි වූ පිරිස	240
ස්ථානය	මාකඳුර පරිශ්‍රය (ZOOM තාක්ෂණය ඔස්සේ)

19. වෘත්තීය දැනුවත් කිරීමේ වැඩසටහන (වෘත්තීය මාර්ගෝපදේශණ ක්‍රියාකාරකම්) කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
සම්පත් දායකත්වය හා තාක්ෂණික සහයෝගය – ආචාර්ය ඩබ්. එම්. ඩබ්. ඩබ්. කන්දේගම මහතා, වෘත්තීය මාර්ගෝපදේශන සම්බන්ධීකාරක කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

දිනය	2020 දෙසැම්බර් 19
ඉලක්ක ක්ෂේත්‍රය	සේවා නියුක්ත කුසලතා වර්ධනය
ඉලක්ක කණ්ඩායම	දෙවන වසර සිසුන්
සහභාගි වූ පිරිස	240
ස්ථානය	මාකඳුර පරිශ්‍රය (ZOOM තාක්ෂණය ඔස්සේ)

19.3.7 2020 වර්ෂයේ වැඩසටහන් සමාලෝචනය

2020 වර්ෂයේදී වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය ක්‍රියාකාරකම් 19 ක් පීඨ 6 ක සිසුන් සඳහා මෙහෙයවීමට සමත් විය.

පීඨයේ නම	මෙහෙයවන ලද වැඩ සටහන් ගණන
කෘෂිකර්මය හා වැවිලි කළමනාකරණ පීඨය	06
ව්‍යවහාරිකවිද්‍යා පීඨය	03
ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය	03
පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය	00
තාක්ෂණ පීඨය	04
වෛද්‍ය පීඨය	02
මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙක	00
කුලියාපිටිය පරිශ්‍රයේ පීඨ දෙක	00
විශ්වවිද්‍යාලයේ පීඨ හතර	03
අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා	00
එකතුව	**19**

19.3.8 2020 වර්ෂයේ අපගේ වැඩසටහන් මඟින් සිසුන්හට අත් වූ වාසි සහ ලද අවස්ථා

- නායකත්ව පුහුණු
- ශිෂ්‍ය එකමුතු වැඩසටහන්
- බාහිර වැඩසටහන්
- ආයතනික පුහුණු
- රැකියා අවස්ථා සඳහා ස්ථාන ලැබීම්
- ජීව දත්ත පත්‍රිකා ලිවීම
- පුද්ගල උපදේශනය
- ශිෂ්‍ය දත්ත පද්ධති
- රැකියා පොළ
- පෞරුෂත්ව සහ ආකල්ප සංවර්ධනය

19.3.9 2020 වර්ෂයේ ලක් විශේෂ ජයග්‍රහණ

- වයඹ GEVEL Club ආරම්භ කිරීම
- වර්ෂය තුළ වැඩසටහන් 19ක් ක්‍රියාත්මක කිරීම

19.3.10 2020 වර්ෂයේ වෘත්තීය සංවර්ධනය

වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ කාර්යමණ්ඩලය සඳහා මානව සම්පත් සංවර්ධනය

- පර්යේෂණ කටයුතු සඳහා දායක වීම
- නව පුහුණු සහ සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගි වීම
- උසස් අධ්‍යාපනය සහ ක්ෂේත්‍ර චාරිකා සඳහා සම්බන්ධ වීම
- අනුමත තනතුරු පුළුල් කිරීම

➢ භෞතික සම්පත් සංවර්ධනය

අංගය	ප්‍රමාණය
1. ලැප්ටොප් පරිගණක	03
2. වැසිකිළි	01
3. පොත් රාක්ක	02
4. වානේ අල්මාරි (අඟල් 6x4)	02

➢ සිසුන් සඳහා නව වැඩ සටහන්

- ආදර්ශ සම්මුඛ පරීක්ෂණ (පටිගත කිරීම් සමග)
- සමාජ වගකීම් වැඩ සටහන් සහ සේවා
- ක්ෂේත්‍ර චාරිකා සඳහා සහ පර්යේෂණ සඳහා දායක වීම
- ශිෂ්‍ය තොරතුරු ජාල ගත කිරීම
- ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන වැඩසටහන්
- රැකියා සඳහා බඳවා ගන්නා ආයතන සමග සම්බන්ධ වීම

2020 වර්ෂය තුළ දී වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය වැඩ සටහන් 19 ක් මෙහෙය වන ලද අතර අපගේ ශිෂ්‍යයන්ට පහත සඳහන් පුද්ගල හැකියාවන් වර්ධනය කර ගැනීමට හැකි විය.

- නව චින්තනය
- උනන්දුව ඇතිකර ගැනීම
- නිර්මාණාත්මකබව
- නම්‍යශීලී බව
- සම්පත්දායකත්වය
- කාර්යශූර
- ශක්‍යතාපිරි
- අවංක
- ස්වයං ප්‍රලෝභන
- ධනාත්මක ආකල්ප පිරි
- උපායශීලී
- වගකීම් දරන
- වෙළඳ ක්ෂේත්‍රයට අවතීර්ණ වන
- සිතීමේ හැකියාවෙන් යුත්
- විනය ගරුක
- දැඩිව ක්‍රියාවන්හි එල්බගත්
- විනෝදකාමී
- උනන්දුවෙන් පිරි

19.3.11 2020 වර්ෂයේ සියලු වැඩ සටහන් සඳහා වැය වූ මුළු වියදම

අංකය	වැඩසටහන	වියදම (රු)
01	තාක්ෂණ පීඨයේ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන	-
02	කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ තේ රස බැලීමේ වැඩසටහන	14,995.00
03	තාක්ෂණ පීඨයේ නායකත්ව සංවර්ධන වැඩසටහන (01 කොටස) තාක්ෂණ පීඨය	-
04	තාක්ෂණ පීඨයේ නායකත්ව සංවර්ධන වැඩසටහන (02 කොටස) තාක්ෂණ පීඨය	-
05	දෙදින භාහිර පුහුණු වැඩසටහන (පළමු වැඩසටහන) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය	361,900.00
06	දෙදින භාහිර පුහුණු වැඩසටහන (දෙවන වැඩසටහන) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය	350,350.00
07	රැකියා අයදුම්පත සැකසීම ව්‍යවහරිකවිද්‍යා පීඨය	-
08	දෙදින භාහිර පුහුණු වැඩසටහන (තෙවන වැඩසටහන) - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය	365,750.00
09	දෙදින භාහිර පුහුණු වැඩසටහන (සිව්වන වැඩසටහන) - ව්‍යවහරිකවිද්‍යා පීඨය	327,250.00
10	දෙදින භාහිර පුහුණු වැඩසටහන (පස්වන වැඩසටහන) - තාක්ෂණ පීඨය	319,550.00
11	වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන ව්‍යවහරිකවිද්‍යා පීඨය	-
12	වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය	-
13	කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ තේ රස බැලීමේ වැඩසටහන	16,765.00
14	GEVEL Club වයඹ විශ්වවිද්‍යාලය - විධායක කමිටු රැස්වීම 01	-
15	GEVEL Club වයඹ විශ්වවිද්‍යාලය - විධායක කමිටු රැස්වීම 02	-
16	වෘත්තීය සංවර්ධනය සහ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳ වැඩමුළුව- කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය	-
17	GEVEL Club වයඹ විශ්වවිද්‍යාලය - පළමු රැස්වීම	-
18	වෘත්තීය සැලසුම් කිරීම සහ පෞද්ගලික ඉලක්ක ලඟා කරගැනීම වැඩමුළුව කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය	-
එකතුව		**1,044,310.00**

19.4 තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය - කුලියාපිටිය පරිශ්‍රය

19.4.1 හැඳින්වීම

කුලියාපිටිය පරිශ්‍රයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මඟින් කුලියාපිටිය පරිශ්‍රයේ විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා තොරතුරු තාක්ෂණික සේවාව සහ තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන් සැපයේ. මේ මඟින් සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ පුහුණුවල කාර්ය මණ්ඩලය සහ බාහිර වෘත්තිකයන්ගේ තොරතුරු තාක්ෂණ පුහුණුව සඳහා සේවය ලබාදෙයි. මෙම අංශය මඟින් අධ්‍යයන කටයුතු සඳහා නොමඳ දායකත්වයක් ලබාදෙයි. එමගින් තොරතුරු තාක්ෂණ සක්‍යතාවල සුදුසු පරිසරාත්මක පසුබිමක් ඔස්සේ ලබාදෙන අතර අධ්‍යාපන හා පර්යේෂණ වැඩසටහන් සඳහා පරිගණක පහසුව සැපයේ.ඒ අනුව තොරතුරු තාක්ෂණයේ නවතම උපාංග භාවිතයෙන් සේවය සැපයීම සිදුකෙරේ. මෙම සේවාවන්ට විද්‍යුත් තැපෑල, අන්තර්ජාල පහසුකම්, ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය, අන්තර්ජාල නඩත්තුව ආදිය ඇතුලත් වේ. තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් විද්‍යුත් අධ්‍යයන ඇරඹුම් (ඉගෙනුම් ආධාරක පරිගණක ගත කිරීම, ඉගෙනුම් කළමනාකරණ පද්ධති) මෙමගින් සැපයේ. අධ්‍යයනාංශ සහ ඒකක සඳහා ඔවුන්ගේ තොරතුරු මාර්ගගත (Online) පද්ධතිය හරහා සැපයීම සිදු කෙරේ.

19.4.2 පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන්

- ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ සහ ව්‍යාපාර අධ්‍යයන මූල්‍ය පීඨයේ අභ්‍යන්තර ශිෂ්‍යයන් සඳහා ඩිප්ලෝමා සහ උසස් සහතික පත්‍ර පාඨමාලා මෙහෙයවීම.
- බාහිර අයඳුම්කරුවන් සඳහා ඩිප්ලෝමා පාඨමාලාව (මුදල් අය කෙරේ)
- රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සඳහා කෙටි කාලීන පුහුණු වැඩ සටහන් මෙහෙය වීම.
- කාර්යමණ්ඩලය සඳහා කෙටි පුහුණු වැඩසටහන්
- LMS – දැනුවත් කිරීමේ වැඩසටහන්
- ව්‍යවහාරිකවිද්‍යා පීඨය, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය, තාක්ෂණ පීඨය, සහ වෛද්‍ය පීඨය යන පීඨයන්හි අභ්‍යන්තර සිසුන් සඳහා විෂයානුබද්ධ වැඩමුළු පැවැත්වීම.

19.4.3 කුලියාපිටිය පරිශ්‍රයේ පීඨ හතර සඳහා විද්‍යාගාර පහසුකම් සැපයීම

මෙම මධ්‍යස්ථානය සඳහා පරිගණක විද්‍යාගාර තුනක් ඇත. මෙයින් විශාලතම විද්‍යාගාරයේ පරිගණක 40ක් අඩංගුවන අතර අනෙකුත් විද්‍යාගාර දෙකෙහි 20 බැගින් වන පරිදි පරිගණක පහසුව ඇත. මෙම විද්‍යාගාර පෙ.ව. 8.00 සිට ප.ව. 8.00 දක්වා සතියේ දිනවල විවෘතව තැබෙන අතර සෙනසුරාදා දිනවල පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා විවෘතව පවතී.

19.4.4 කාර්යමණ්ඩලය

පද්ධති ඉංජිනේරු	- 01
උපදේශක - පරිගණක තාක්ෂණ	- 01
කථිකාචාර්ය (ආධුනික) පරිගණක තාක්ෂණ	- 01
කාර්මික නිලධාරී	- 02

කළමනාකරණ සහකාර	- 02
විද්‍යාගාර සහායක	- 02
වැඩසහායක	- 01

19.4.5 වර්ෂය තුළ ප්‍රගතිය

- විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සහ නඩත්තු කටයුතු
- බාහිර සිසුන් සඳහා ඩිප්ලෝමා පාඨමාලාවේ VI වන වැඩසටහන සාර්ථකව නිම කිරීම
- රැහැන් රහිත ජාලය පුළුල් කිරීම
- වේගවත් සහ විශ්වසනීය ජාල පහසුකම් පද්ධතියක් කුලියාපිටිය පරිශ්‍රයේ ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සහයෝගය ඇතුව ෆයිබර් ඔප්ටික් කේබල් එළීම අවසන් කිරීම.
- විශ්වවිද්‍යාලයේ උත්සව ශාලාරූපකරණය සහ වීඩියෝ පටිගත කිරීම සඳහා පහසුකම් සැපයීම
- විශ්වවිද්‍යාලයේ ප්‍රධාන උත්සවය වන උපාධි ප්‍රදානෝත්සවය සහ සාකච්ඡා සහා සඳහා Live Web Casting පහසුකම් සැපයීම
- 5 වන ගණකාධිකරණ සහ මූල්‍ය පර්යේෂණ සාකච්ඡා සභාව (SACFIRE 2019) සහ 08 වන ජාත්‍යන්තර ආර්ථික විද්‍යා පර්යේෂණ සමුළුව (SLERC) සඳහා මෙන්ම විශ්වවිද්‍යාලයේ ලේඛන වට්ටෝරු කළමනාකරණ පද්ධතිය සහ සිසුන්ගේ ප්‍රතිඵල කළමනාකරණ පද්ධතිය යන කටයුතු සඳහා පහසුකම් සැපයීම
- සියලු අධ්‍යයනාංශ සඳහා LMS මඟින් Online විභාග පහසුකම් සැපයීම

19.4.6 දුෂ්කරතාවන්

- කාර්ය මණ්ඩලය සඳහා යටිතල පහසුකම් සැපයීමට ප්‍රතිපාදන හිඟ වීම
- වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව පරිගණක විද්‍යාගාර පුළුල් කිරීම සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොවීම
- මෙම මධ්‍යස්ථානය ස්ථාපිතව ඇත්තේ පරිගණක මධ්‍යස්ථානයකට සුදුසු නොවන ඉතා පැරණි ගොඩනැඟිල්ලකය
- මෙම ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කළ නොහැකි මට්ටමක පවතින හෙයින් සේවා අවශ්‍යතා සඳහා පුළුල් කිරීම් කළ නොහැකි අතර කාර්යමණ්ඩලයේ කටයුතු සඳහා ද ආරක්ෂාව සඳහා ද මහත් බාධාවක්ව පවතී.

19.4.7 අනාගත සංවර්ධනය සඳහා යෝජනා

- මෙම ගොඩනැඟිල්ල ඉතා පැරණි සහ පරිගණක මධ්‍යස්ථානයකට සුදුසු නොවන හෙයින් කුලියාපිටිය පරිශ්‍රයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැඟිල්ලක් අවශ්‍ය කෙරේ
- බාහිර පුද්ගලයන් සඳහා වැඩමුළු පැවැත්වීම
- රැහැන් රහිත ජාලය පුළුල් කිරීම
- අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම.

- සාමාන්‍ය තොරතුරු තාක්ෂණ සහතිකපත්‍ර පරීක්ෂණ සඳහා සිසුන් පුහුණු කිරීම
- මෘදුකාංග සංවර්ධන / පරිගණක ජාල ගත කිරීම සහ තොරතුරු පද්ධති සංවර්ධනය සඳහා වන බාහිර ව්‍යාපෘති සිදු කරන ශිෂ්‍ය පාදක ඒකකයන් ගොඩ නැගීම
- පවත්නා ඉල්ලුමට සාපේක්ෂව අභ්‍යන්තර හා බාහිර සිසුන්ගේ දැනුම පුළුල් කළ හැකි සේවා සැපයීම සඳහා වන පහසුකම් වැඩි කිරීම

19.4.8 වෙනත් අදාළ තොරතුරු

තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳව සහ සේවා පිළිබඳව අවස්ථා විශාල සංඛ්‍යාවක් පවත්නා හෙයින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සහ පොදු මහජනතාවගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ දැනුම සහ සේවා මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීම සඳහා කටයුතු කළ යුතුය. තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මහජන සම්බන්ධතා පවත්වන ප්‍රධාන අංගයක් සහ මහජනතාව වෙත අධ්‍යාපන අවස්ථා සලසා දෙන අංශයකි. මෙම පහසුකම් වැඩිකරලීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය නව ගොඩනැගිල්ලක ස්ථාපිත කිරීම ඒකමතිකව අනුමත කෙරේ. එමගින් සේවා පුළුල් කිරීම, ජන සහභාගීත්වය වැඩිකිරීම, මෙන්ම උපකරණ හා උපාංග ආරක්ෂා වීමද සිදු වනු ඇත.

19.5 තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය

19.5.1 හැඳින්වීම

සිසුන්ගේ ශීඝ්‍රයෙන් දියුණුවන විෂය ක්ෂේත්‍රවලට අදාළ තොරතුරු තාක්ෂණ අභියෝගයන්ට මුහුණ දීමට හැකි සේවාවක් සැපයීම සඳහා මාකඳුර තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවා ඇත. එමෙන්ම මේ නිසා ඔවුන්ට පරිගණක සාක්ෂරතාව මෙන්ම ඉහළ වෘත්තීය කාර්ය සාධනයක් ලබා ගැනීමට පහසුකම් සැලසී ඇත.

මෙම ඒකකය මඟින් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සඳහා තොරතුරු තාක්ෂණ හා උසස් පරිගණක භාවිතය පිළිබඳ පාඨමාලා ඉදිරිපත් කරන අතර පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය සඳහා පරිගණක තාක්ෂණ පාඨමාලාව පවත්වනු ලැබේ. එමෙන්ම අධ්‍යයනාංශ මඟින් පවත්වන සංඛ්‍යානය ආශ්‍රිත පාඨමාලා සඳහා විශේෂයෙන්ම ප්‍රායෝගික පරීක්ෂණවල දී මෙම ඒකකය මඟින් සේවාව සැපයේ. ඊට අමතරව විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ බාහිර උපාධි පාඨමාලාව හදාරන සිසුන්ට පරිගණක තාක්ෂණය සහ විද්‍යුත් වාණිජ්‍ය හා තොරතුරු කළමනාකරණ පද්ධති යන පාඨමාලා පවත්වනු ලැබේ. එමෙන්ම පළාතේ බාහිර ප්‍රජාවට ප්‍රයෝජනවත් වන පරිගණක තාක්ෂණයට සම්බන්ධ පාඨමාලා කීපයක්ම පවත්වමින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මඟින් වඩාත් ප්‍රළුල් සේවාවක් සැපයේ.

මෙම මධ්‍යස්ථානය සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 8.00 දක්වාත්, සෙනසුරාදා දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 5.00 දක්වාත්, විභාග කාලය තුළ දී සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 10.00 දක්වාත් විවෘතව පවතී.

19.5.2 පුහුණු / දැනුවත්කිරීමේ වැඩසටහන්

තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මඟින් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ සහ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

19.5.3 පර්යේෂණ කටයුතු

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එච් ඒ සී කේ ජයතිලක මහතා " ග්‍රාමීය ජනතාව සඳහා තිරසාර දැනුම හුවමාරු කිරීමේ ක්‍රමවේදයක් : ශ්‍රී ලංකාවේ අපනයන කෘෂිකාර්මික ගොවීන් සම්බන්ධ අධ්‍යයනයක්" නැමැති පර්යේෂණය කරමින් සිටියි. මීට අදාළ අරමුදල වයඹ විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ ලැබිණි. (අරමුදල් අංක SRHDC/RP/04/18-06)
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ් කේ ජී කේ එස් වීරසිංහ මිය " ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල තොරතුරු සන්නිවේදන තාක්ෂණය ඉගැන්වීම සඳහා අපොස උසස් පෙළ උගන්වන ගුරුවරුන්ගේ සූදානම සඳහා අවශ්‍ය පසුබිම සැකසීම" යන මැයෙන් යුත් පර්යේෂණයක් කරමින් සිටියි. මීට අදාළ අරමුදල වයඹ විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ ලැබිණි. (අරමුදල් අංක SRHDC/RP/04/18-05). පර්යේෂණය සමාප්ත් වූ හෙයින් පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

19.5.4 ප්‍රකාශන

- ඩී. පී. ඩන්ස්ෆෝර්ඩ්, ඩී. එම්. අයි. ඩී. දිසානායක, ටී. ඩී. නුවරපක්ෂ, කේ. එස්. වීරසිංහ, ය නඅය විසින් පොල්වතුවල ක්‍රියාකාරීත්වය ඇගැයීම, කුරුණෑගල වැවිලි සමාගම යටතේ පාලනය වන පොල් වතුවල ක්‍රියාකාරීත්වය ඇගැයීම සඳහා ක්‍රමවේදයක් සැකසීම යන පර්යේෂණය ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සාකච්ඡා සභාවට 2020 ඔක්තෝබර් මස 15 සහ 16 යන දිනවල ප්‍රකාශයට පත් කරන ලදී.

- කේ එස් වීරසිංහ, කේ එච් එන් එච් විමලරත්න, සහ ඩබ් ජේ එස් කේ වීරක්කොඩි යන අය විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් Digital උපකරණයක් සැකසීම පිළිබඳ පර්යේෂණ පත්‍රිකාව ගෝලීය අධ්‍යයන සහ පර්යේෂණ ආයතනයේ සැසි වාරය සඳහා ඉදිරිපත් කරන ලදී.

- ගෝර්ඩින් ඒ ගෝච්, උවසරා දිසානායාක, චන්දන කේ ජයතිලක, ඉසුරි කුමාරසිංහ, කුමුදු ආරියවංශ, සදුනි රත්නායක, (2020)ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික දියුණුව උදෙසා තොරතුරු සන්නිවේදන තාකෂණ නායකත්ව අධ්‍යාපනයත තාක්ෂණ භාරකාරත්ව පුහුණු වැඩසටහන් ඇගැයීම යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් අධ්‍යාපන සහ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර සඟරාවේ පළ කරන ලදී.

- ජේ ඒ එස් එන් එස් යූ කේ ජයකොඩි, ජයසිංහ මුදලිගේ සහ එච් ඒ සී කේ ජයතිලක යන අය විසින් ශ්‍රී ලංකාවේ කෘෂි ආහාර අගයන් පිළිබඳව කාබනික පොහොර සැකසීම හා භාවිතය පිළිබඳව තත්වය ඉහල නැංවීමේ ප්‍රවර්ධණ උපාංගයක් යන මැයෙන් පර්යේෂණ පත්‍රිකවක් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 13 වන ජාත්‍යන්තර පර්යේෂණ සාකච්ඡා සභාවට 2020 ඔක්තෝබර් මස 15 සහ 16 යන දිනවල ඉදිරිපත් කරන ලදී.

- ගෝර්ඩින් ඒ ගෝච්, උවසරා දිසානායාක, අටහරුල් චෞද්‍රි, චන්දන කේ ජයතිලක, ජීට් රම්ජට්ටාන්, චේන් ගන්පට්, ඉසුරි කුමාරසිංහ, කුමුදු ආරියවංශ, සදුනි රත්නායක, (2020) යන අය විසින් තාක්ෂණික භාරකාරත්වය සහ හැකියා ප්‍රවේශය ; ශ්‍රී ලංකාව සහ ට්‍රිනිඩෑඩ් හි භාවිත කෘෂිකාර්මික ප්‍රජාවගේ නායකත්ව පුහුණු ඇගැයීමේ ක්‍රමවේදය යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් 2020 ජූනි 30 සිට ජූලි 02 දක්වා පැවති මානව සංවර්ධන සහ ශක්‍යතා සංගමයේ සමුළුව සඳහා ඉදිරිපත් කරන ලදී.

- ගෝර්ඩින් ඒ ගෝච්, උවසරා දිසානායාක, චන්දන කේ ජයතිලක, ඉසුරි කුමාරසිංහ, කුමුදු ආරියවංශ, සදුනි රත්නායක, (2020) යන අය විසින් තාක්ෂණ භාරකාරත්ව පුහුණුව (කෘෂිකාර්මික ප්‍රජාව සඳහා; ශ්‍රී ලංකාවේ සහභාගීත්ව පර්යේෂණ ස්ථාපිත කිරීම යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් 2020 මාර්තු මස 25 සහ 27 දිනවල චීනයේ එක්සත්ජාතීන්ගේ විශ්වවිද්‍යාල අයතනයේ 11 වන ජාත්‍යන්තර සංවර්ධණ තොරතුරු සංගමයේ සම්මේලනය සඳහා ඉදිරිපත් කරන ලදී.

- ඩබ් ඩී සමන්වික්‍රම, එල් මුණසිංහ, එල් ඩී අර් ඩී පෙරේරා යන අය විසින් Efficacy of Using SVM on IOT security Threat Identification Under Reduced Feature Set Architecture Compared to J48 and Random Forest Algorithms Using USI Benchmark Dataset යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් 2020 පැවති වයඹ විශ්වවෙද්‍යාලයීය පර්යේෂණ සමුළුවට ඉදිරිපත් කරන ලදී.

19.5.5 අය වැය

ස්ථාවර වත්කම් සඳහා වෙන් කිරීම් රුපියල් මිලියන 1.0

19.5.6 වර්ෂය තුළ ප්‍රගතිය

- එච් ඒ සී කේ ජයතිලක මහතා විසින් පීඨයන් සහ මධ්‍යස්ථාන වල වෙබ් අඩවි නඩත්තු කිරීම් සිදු කරන ලදී (https://fapm.wyb.ac.lk, https://flfn.wyb.ac.lk, https://ictm.wyb.ac.lk, https://aeb.wyb.ac.lk, https://sdc.wyb.ac.lk,)
- තොරතුරු තාක්ෂණ මධ්‍යස්තානය මගින් පවත්වනු ලැබූ දේශණ සහ ප්‍රායෝගික ඉගෙනුම් කළමනාකරණ පද්ධති සඳහා අන්තර්ගතයන් අප විසින් සංවර්ධනය කරන ලදී.
- Moodle 3.8 සංස්කරණය යටතේ නව ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කර ඇත.
- LEARN Identity Access Fedaration සේවාව යටතේ ඇති Identity Provider සේවාව ස්ථාපනය කර සකසන ලදී. මෙම සේවාව eduGAIN ජාත්‍යන්තර අන්තර් සම්මේලනයේ සාමාජිකයෙකි
- මාකඳුර පරිශ්‍රයේ ප්‍රධාන ආපනශාලා ගොඩනැගිල්ලට රැහැන් රහිත අන්තර් ජාල සේවාව පුලුල් කරන ලදී
- මාකඳුර පරිශ්‍රයේ ZOOM සේවාව සඳහා පහසුකම් සපයන ලදී
- මාකඳුර පරිශ්‍රයේ ශිෂ්‍ය ප්‍රජාව සහ කාර්යමණ්ඩලය සඳහා OFFICE 365 මෘදුකාංග සේවාව සපයන ලදී
- පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ ජාලාකරණ අධියර III සම්පූර්ණ කරන ලදී.
- කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ නව පීඨාධිපති කාමරය වෙත රැහැන් රහිත (Wifi) අන්තර්ජාල පහසුකම ලබා දෙන ලදී
- ප්‍රධාන පිවිසුම් ආරක්ෂක කාර්යාලය ජාල ගත කරන ලද අතර එයද විශ්වවිද්‍යාලයීය ජාලපද්ධතියට (Local Area Network) එක් කරන ලදී
- පීඨ වෙබ් අඩවි සඳහා Hosting පහසුකම ලබා දෙන ලදී (https://fapm.wyb.ac.lk, https://flfn.wyb.ac.lk, https://aeb.wyb.ac.lk, https://sdc.wyb.ac.lk)
- CCTV කැමරා පද්ධතිය ක්‍රියාත්මක කිරීම මගින් පරිශ්‍රයේ ආරක්ෂාව තර කර ඇත
- අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා විශ්වවිද්‍යාල විද්‍යුත් තැපැල් පහසුකම ලබා දෙන ලදී

19.5.7 2020 වර්ෂය තුළ මිල දී ගන්නා ලද උපකරණ සහ උපාංග

අයිතම	ප්‍රමාණය
UPS 1kVA	02
Multifunctional Network Printer	01
Speed Light	01
Desktop Computer (5Nos)	05
Laminating Machine	01
Hard Disk (Server)(2Nos)	02
Switch (2Nos)	03
Inkjet Color Printer	01
Multifunctional Printer	01
Laser Color Printer	01
Server	01
Monitor 43”	01
Camera Battery	02
Stereo Headphones	30
RAM Modules	75
Laptop	05
MM Short Throw Projector	01
Desktop Computers	33
Half Door Cupboard with file rack	03

19.5.8 සීමාවන් තිබේ නම්

නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු, පවතින ප්‍රතිපාදන නොමැතිකම නිසා ප්‍රමාද වී ඇත. දැනට පරිගණක විද්‍යාගාරයේ ප්‍රායෝගික පුහුණුවීම් සඳහා පවතින ඉඩකඩ කළමනාකරණය කිරීම අපහසු වී ඇත.

19.5.9 අනාගත සංවර්ධනය සඳහා යෝජනා

- සුගලාදේවී නේවාසිකාගාරය ජාලගත කිරීම සඳහා සැලසුම් කරන ලදී
- කෘෂිකර්ම හා වැවිලි කළමනාකරන පීඨයෙහි විභාග ශාලාව සඳහා CCTV කැමරා පද්ධතියක් යෝජනා කර ඇත

19.5.10 අනෙකුත් තොරතුරු

LEARN විසින් සංවිධානය කරන ලද “පුහුණුවන්නන් පුහුණු කිරීමේ ZOOM වැඩමුළුව” සඳහා ඊ. එම්. ඩී. එස්. ඒකනායක මහතා සහභාගි විය

19.6 වෛද්‍ය මධ්‍යස්ථානය



වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථාන දෙකක් ක්‍රියාත්මක වේ. එයින් එකක් කුලියාපිටිය පරිශ්‍රයේ ස්ථාපිත වී ඇති අතර අනෙක මාකඳුර පරිශ්‍රයේ ස්ථාපනය කර ඇත. මෙමගින් 2020 වර්ෂය තුළ දී සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි. 2018 වර්ෂයේ මෙන්ම 2019 වර්ෂයේ දී ද කුලියාපිටිය පරිශ්‍රයේ කාර්ය මණ්ඩලය සාත්තු සේවකයකු, මහජන සෞඛය පරීක්ෂකවරයකු, ඖෂධවේදියෙකු, ලඝු ලේඛිකාවක සහ කම්කරුවෙකු යන අයගෙන් සමන්විත විය. මාකඳුර පරිශ්‍රයේ ද ලඝු ලේඛිකා තනතුර හැර අනෙකුත් තනතුරු සමානව ඇත

2018/ 2019 වර්ෂවල අලුතින් පත්වීම් ලද විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලයේ සහ අලුතින් පළමු වසරට අතුළත් වූ සිසුන් සඳහා වෛද්‍ය සහතික වෛද්‍ය නිලධාරී විසින් අනුමත කරන ලදී. ක්‍රීඩා කටයුතු සඳහා තෝරා ගන්නා ලද සිසුන්ගෙන් සහ ආපනශාලා සේවකයන්ගේ වෛද්‍ය පරීක්ෂණ (Medical Examinations) සිදු කරන ලදී.

විශ්වවිද්‍යාලයීය සිසුන්ගෙන් සහ කාර්ය මණ්ඩලයේ සුළු ප්‍රතිකාර කටයුතුවලට අමතරව රෝග නිවාරණ වැඩසටහන් හා විශ්වවිද්‍යාල සිසුන්ගේ සෞඛ්‍ය අධ්‍යාපනය සඳහා වෛද්‍ය මධ්‍යස්ථානය සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළේය. 2020 වර්ෂය තුළ දී සෞඛ්‍ය අභිවෘද්ධි වැඩසටහන් ගණනාවක් සිදු කර ඇත.

1. තැලසීමියා සඳහා ජනතාව පරීක්ෂා කිරීමේ වැඩසටහන
2. ප්‍රජා සෞඛ්‍ය සහ ලිංගිකව බෝවන රෝග පිළිබඳව සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් මෙහෙයවීම.
3. අයාලේ යන සුනඛයන් හා බළලුන් වඳභාවයට පත් කිරීමේ වැඩසටහන
4. ජලභීතිකා එන්නත් කිරීමේ වැඩසටහන
5. බරවා රෝග පරීක්ෂණ
6. වාර්ෂික ආහාර හා ජල සාම්පල පරීක්ෂා කිරීමේ වැඩසටහන
7. කෘමීන් හා මදුරුවන් සඳහා ධූමායනය කිරීමේ වැඩසටහන යටතේ සියලු කාර්යමණ්ඩල සහ ශිෂ්‍ය නේවාසිකාගාර පරිශ්‍රයන් සඳහා රසායනික ධූමායනය යොදන ලදී
8. වර්ධිත මදුරු පාලන ක්‍රියාමාර්ගයක් ලෙස මැඩියන් යෙදීමේ වැඩසටහන සිදු කෙරිණි
9. කොවිඩ්19 රෝගය වැළැක්වීමේ ක්‍රියාමාර්ගවලට අදාළ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් මෙහෙය වන ලදී.
10. කොවිඩ් 19 වැළැක්වීමට අදාලව සනීපාරක්ෂක පහසුකම් සපයන ලදී

සාමාන්‍යයෙන් ගත් කල වෛද්‍ය මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය කණ්ඩායමක් ලෙස කුලියාපිටිය සහ මාකඳුර පරිශ්‍රයේ විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා උපකාර කිරීමට සමත් විය.

19.7 වයඹ විශ්වවිද්‍යාල ව්‍යාපාර ප්‍රවර්ධන මධ්‍යස්ථානය (WUBIC)/ විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා (UBL) ඒකකය

19.7.1 හැඳින්වීම

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය (WUSL) වයඹ විශ්වවිද්‍යාල ව්‍යාපාර ප්‍රවර්ධන මධ්‍යස්ථානය (WUBIC) ක්‍රියාවට නංවන ලද්දේ ප්‍රායෝගිකව සහ ශිෂ්‍යයන්ගේ ව්‍යාපාර නැඹුරුව සංවර්ධනය කිරීමේ මූලික අරමුණු ඇතිවය. ශිෂ්‍ය ව්‍යාපෘති, ව්‍යාපාර සඳහා (තාක්ෂණික) උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම, ව්‍යාපාර සහ විශ්වවිද්‍යාලය අතර පර්යේෂණ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සහ 2015 වසරේ විශ්වවිද්‍යාලවල පර්යේෂණ යටිතල පහසුකම් සහ හැකියාවන් වර්ධනය කිරීම සඳහා පුද්ගලික අංශය සමඟ උපාය මාර්ගික සහයෝගීතා ප්‍රවර්ධනය කිරීම. ව්‍යාපාර සහ විශ්වවිද්‍යාලය අතර පර්යේෂණ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා (IP) බුද්ධිමය දේපල ප්‍රතිපත්තිය ද අනුගමනය කරන ලදී. ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ දැනට ලියාපදිංචි වී සිටින ඕනෑම සිසුවෙකු, මෑතකදී උපාධිය ලබා ඇති (ඔවුන්ගේ උපාධිය ලබාගත් දින සිට වසර 5 දක්වා) ශිෂ්‍යයෙකු සහ අධ්‍යයන, පරිපාලන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල සාමාජිකයෙකු WUBIC හි සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබන අතර ප්‍රවර්ධන අපේක්ෂකයෙකු ලෙස සැලකේ. ඔවුන්ගේ ව්‍යාපාරයේ පූර්ව ලියාපදිංචි තක්සේරු කාලය තුළදී, WUBIC විසින් ඔවුන්ට සපයා ඇති කාර්යාල අවකාශය, අන්තර් ජාල පහසුකම් සහිත ලැප්ටොප් පරිගණක, ලිපිද්‍රව්‍ය සහිත වෙනත් කාර්යාලීය උපකරණ සහ ව්‍යාපාරික ලෝකයේ දියුණුව සඳහා ප්‍රවාහන මාධ්‍යයන් සපයමින් ඔවුන්ව වසර දෙකක් දක්වා පෝෂණය කරනු ඇත.

2018 වර්ෂයේදී වයඹ විශ්වවිද්‍යාලයීය ව්‍යාපාර ප්‍රවර්ධන මධ්‍යස්ථානය ව්‍යාපාර සම්බන්ධතා ඒකකය (UBL) සමග එක්ව ලෝක බැංකුව මගින් ප්‍රතිපාදන සපයන ලද උසස් අධ්‍යාපන පුළුල් කරන සහ සංවර්ධන කඩිනම් ව්‍යාපෘතිය (AHEAD) යටතේ ඒකක ක්‍රියාකාරකම් විධිමත්ව සැලසුම් කරන ලද. ව්‍යාපාර සම්බන්ධතා ඒකකයේ (UBL Cell) මූලික අරමුණ වන්නේ උපාධි අපේක්ෂකයින් තුළ ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කිරීමට හැකි වන පරිදි ව්‍යවසායක විද්‍යාඥයින් සමූහයක් නිර්මාණය කිරීම අවසානයේ ජාතික ආර්ථිකය නඟා සිටුවීමට දායක වීමයි. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය, උපාධිධාරී සහ උපාධි අපේක්ෂක ප්‍රජාව විසින් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදන වාණිජකරණය කිරීමට මාර්ග ගවේෂණය කිරීම සහ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ පර්යේෂණ ප්‍රතිඵල ලෙස සංවර්ධනය කරන ලද තාක්ෂණයන් හුවමාරු කිරීම සඳහා විභව කර්මාන්ත හඳුනා ගැනීම ව්‍යාපාර සම්බන්ධතා ඒකකයේ (UBL Cell) ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

19.7.2 වයඹ විශ්වවිද්‍යාල ව්‍යාපාර ප්‍රවර්ධන මධ්‍යස්ථානය/ විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා අංශයෙහි කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂවරුන්:

මහාචාර්ය ගමික ප්‍රතාපසිංහ - හිටපු අධ්‍යක්ෂ WUBIC/ UBL (2015 -2020)

ආචාර්ය මංජුල වික්‍රමසිංහ - අධ්‍යක්ෂ WUBIC/UBL (2020 - අද දක්වා)

UBL කළමනාකරු

ඩබ් සී බී විජේසිංහ - විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා අංශයෙහි කළමනාකරු (2019 සිට අද දක්වා)

19.7.3 2020 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම්

1. විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකයේ (UBL) ප්‍රතිපාදන යටතේ ප්‍රසම්පාදන වියදම් සැලැස්මක් සකස් කිරීම

- පළමු වටය සඳහා UBL ප්‍රදානයෙන් අරමුදල් මුදා හැරීම සඳහා වාණිජකරණය කළ හැකි ප්‍රතිඵල සහිත පර්යේෂණ ව්‍යාපෘතිය හඳුනා ගැනීම.
- UBL ප්‍රදානය යටතේ අරමුදල් සපයන පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා අවශ්‍යතා සහ බෙදා හැරිය හැකි ලැයිස්තුව සමඟ ගිවිසුමක් සකස් කිරීම.
- විභව පර්යේෂණ කණ්ඩායම් වලින් ගිවිසුම් ලේඛන එකතු කිරීම.
- UBL ප්‍රදානයේ ප්‍රසම්පාදන වියදම් සැලැස්මේ මුදල් වෙන් කිරීම සහ මුදල් භාවිතා කිරීමට ලෝක බැංකු අනුමැතිය ලබා ගැනීම.

2. වාණිජකරණය කළ හැකි නව නිපැයුම්වල තාක්ෂණික සූදානම මට්ටම (TRL) වැඩි කිරීමට UBL ප්‍රදානයෙන් අරමුදල් නිදහස් කිරීම.

- විවිධ පර්යේෂණ කණ්ඩායම් තුනක් හඳුනා ගන්නා ලදී.
- තෝරාගත් පර්යේෂණ කණ්ඩායම් සමඟ අත්සන් කිරීමට අවශ්‍යතා සහ බෙදාහැරීමේ වගුව සමඟ ගිවිසුම් සකස් කර ඇති අතර පර්යේෂණ කණ්ඩායම් සමඟ ගිවිසුම් අත්සන් කරන ලදී.
- UBL ප්‍රදානයෙන් අරමුදල් මුදා හැරීමට ලෝක බැංකු අනුමැතිය ලබා ගන්නා ලදී.

ව්‍යාපෘති අංකය	ව්‍යාපෘති නම	නව නිපැයුම්කරුවන්ගේ නම්	මුළු අයවැය (Rs)	මුළු කාලය
1	Ready to Serve ටින් කැඳ සහ ඔසු පැන්	මහාචාර්ය ජී ඒ පී චන්ද්‍රසේකර මිය පශුසම්පත් ධීවර හා පෝෂණපීඨය	140,000.00	2020 සැප්තැම්බර් සිට 2021 පෙබරවාරි දක්වා
2	බෝතල් නිෂ්පාදන / රෙදි සෝදන කර්මාන්තය ඉලක්ක කර ගනිමින් අධිවේගී අඩු වියදම් නිෂ්පාදන තත්ත්ව අධීක්ෂණ පද්ධතියක් සංවර්ධනය කිරීම	ආචාර්ය ඩබ්ලිව්.ඒ.එස් විජේසිංහ සහ එම්.ආර්.එච්.ඊ බණ්ඩාර මහතා තාක්ෂණපීඨය	292,000.000	2020 දෙසැම්බර් සිට 2021 දෙසැම්බර් දක්වා
3	නවෝත්පාදන වාණිජකරණය වැඩිදියුණු කිරීම (ICE)	මහාචාර්ය සී.වී.එල්. ජයසිංහ මිය පශුසම්පත් ධීවර හා පෝෂණපීඨය	650,000.00	2020 සැප්තැම්බර් සිට 2021 පෙබරවාරි දක්වා

3. විශ්වවිද්‍යාලය තුළ සංවර්ධනය කරන ලද නිෂ්පාදන වාණිජකරණය කිරීම සඳහා ව්‍යාපාර සම්බන්ධතා ඒකකය UBL හරහා බලපත්‍ර ගිවිසුම් අත්සන් කිරීම

4. පේටන්ට් බලපත්‍ර අයදුම්පත් සහ Prior art සෙවුම් සේවා සැපයීම

- AHEAD DOR පර්යේෂණ කණ්ඩායම (ජලජීවී වගා සහ මත්ස්‍ය අධ්‍යයන අංශය) වෙතින් පේටන්ට් බලපත්‍ර ඉල්ලුම්පත්‍රය UBL හරහා ගොනු කරන ලදී.
- විවිධ පර්යේෂණ කණ්ඩායම් සමඟ Prior art සෙවීම් සිදු කරන ලදී.

පර්යේෂණ කණ්ඩායම්	පීඨය
AHEAD DOR පර්යේෂණ කණ්ඩායම - ජලජීවී වගා සහ මත්ස්‍ය අධ්‍යයන අංශය	පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය
ආචාර්ය සමන් විජේසේකර	පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය
එම්.ආර්.එච්.ඊ. බණ්ඩාර	තාක්ෂණ පීඨය
ආචාර්ය වී.ජී. තරින්ද නිශාන්ත විදානගම	ව්‍යවහාරික විද්‍යා පීඨය
වෛද්‍ය නයෝමි රණතුංග	වෛද්‍ය පීඨය

- තොරතුරු රැස් කිරීම - බුද්ධිමය දේපල ආරක්ෂාව අවශ්‍ය වන පේටන්ට් කළ හැකි නව නිපැයුම් සහ නවෝත්පාදන (සැප්තැම්බර් 2020)

ප්‍රධාන විමර්ශක	පීඨය	නව නිපැයුම
මහාචාර්ය අනෝමා චන්ද්‍රසේකර මිය	පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය	ඔසු පැන්
ආචාර්ය වී.ජී.ටී.එන්.විදානගම මයා	ව්‍යවහාරික විද්‍යා පීඨය	IoT උපකරණ සඳහා Gateway තෝරාගැනීම සඳහා ඇල්ගොරිතම
මහාචාර්ය සී.වී.එල්.ජයසිංහ මිය	පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය	ඔසු යෝගට්
මහාචාර්ය සී.වී.එල්.ජයසිංහ මිය	පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය	Ambient යෝගට්
මහාචාර්ය සී.වී.එල්.ජයසිංහ මිය	පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය	Aloe Vera Suspension
මහාචාර්ය සී.වී.එල්.ජයසිංහ මිය	පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය	ධාන්‍ය වලින් පොහොසත් නිස්සාරණය කළ කෙටි කෑමක්
ආචාර්ය කමනි රත්නායක මිය	කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය	අල පිටිවලින් ග්ලූටන් රහිත කුකීස්

5. 2020 සිට 2021 දක්වා UBL ක්‍රියාකාරකම් සඳහා නව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම

- ප්‍රධාන වශයෙන් ක්‍රියා එකොළහක් හඳුනා ගන්නා ලදී.
- එක් එක් ප්‍රධාන ක්‍රියාකාරකම සඳහා කාලරාමුවක් සමඟ කාර්ය සැලසුම් කර ඇත.

ක්‍රියාව	කාර්යය
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්ම, පසු විපරම් සහ ප්‍රගති අධීක්ෂණයට තාක්ෂණ නිර්මාණය සහ මාරුකිරීමේ ක්‍රියාවලි ඇතුළත් කිරීම.	දෙපාර්තමේන්තු මට්ටමින් UBL (පේටන්ට් බලපත්‍රයක් අයදුම් කිරීම, කර්මාන්ත සමඟ සහයෝගීතා පර්යේෂණ කටයුතු, මූලාකෘති සංවර්ධනය ආදිය) සම්බන්ධ ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ පහසුකම් සැලසීම සහ උපකුලපති, පීඨාධිපතිවරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා සම්බන්ධීකරණය.
UBL විෂය පථයට අදාළ ප්‍රතිපත්ති වෙනස්කම් හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම.	IP බුද්ධිමය දේපල ප්‍රතිපත්ති සහ UBL ආශ්‍රිත අනෙකුත් නීතිමය ලියකියවිලි සොයා බැලීම සඳහා අවශ්‍ය වන ලකුණු වෙනස් කිරීම සහ බලපත්‍ර ගිවිසුම් අත්සන් කිරීම සහ ආරම්භයට පහසුකම් සැලසීම සඳහා නීතිමය ක්‍රියා පටිපාටි සකස් කිරීම.

මාධ්‍ය / වෙබ් අඩවි වේදිකා හරහා සාර්ථක කතා ප්‍රධාන ප්‍රවාහය; නවීන අන්තර්ක්‍රියාකාරී වෙබ් අඩවි	UBL සාර්ථක කථා ඉස්මතු කරමින් වෙබ් ක්ලිප් නිර්මාණය කිරීම. UBL වෙබ් අඩවිය සඳහා පිරිසැලසුම සකස් කිරීම.
තාක්ෂණ නිර්මාණය සහ වාණිජකරණය උපාධි පාඨමාලා සහ පශ්චාද් උපාධි පාඨමාලා සඳහා ඇතුළත් කිරීම.	පවතින මට්ටම වැඩිදියුණු කිරීම සහ තක්සේරු කිරීම. තාක්ෂණය සහ තාක්ෂණ නොවන / ප්‍රතිපත්ති මාරු කිරීම යන දෙකම දිරිමත් කිරීම.
කර්මාන්ත හවුල්කරුවන්ගේ ජාලයක් පවත්වාගෙන යාම සහ තාක්ෂණික හුවමාරුව ප්‍රවර්ධනය කිරීම	වත්මන් කර්මාන්ත හවුල්කරුවන්ගේ විස්තර ඇතුළුව දත්ත සමුදාය සකස් කිරීම සහ තවත් හවුල්කරුවන් එකතු කිරීම. කර්මාන්ත හවුල්කරුවන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීම සහ පශ්චාත් උපාධි සහ උපාධි අපේක්ෂක ව්‍යාපෘති සඳහා නව පර්යේෂණ අදහස් ජනනය කිරීම සහ ඒවා වෙබ් අඩවිය හරහා ප්‍රචාරණය කිරීම. Connect AHEAD යෙදුම භාවිතය ප්‍රවර්ධනය කිරීම. ව්‍යාපාරික සංසඳ සංවිධානය කිරීම සහ අධ්‍යයන සාමාජිකයින් විභව කර්මාන්ත හවුල්කරුවන් සමඟ සම්බන්ධ කිරීම.
WUBIC/UBL" BREAD" Wayomart සහ කර්මාන්තය අතර සහජීවනය ගොඩනැගීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.	BREAD අධ්‍යක්ෂ සමග සම්බන්ධීකරණය සහ Wayomart සහ UBL උපදේශක කමිටුව.
විශ්වවිද්‍යාලය තුළ වාණිජකරණය කළ හැකි නව නිපැයුම් පිළිබඳ තොරතුරු රැස් කිරීම	හඳුනාගැනීමේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා පේටන්ට් බලපත්‍රය, ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙන් කාර්මික සැලසුම් ආරක්ෂාව සහ PCT වෙතින් ජාත්‍යන්තර බුද්ධිමය දේපළ හිමිකම් ආවරණය අවශ්‍ය වේ. UBL හරහා prior art සෙවීම්, පේටන්ට් බලපත්‍ර අයදුම්පත් සහ අයදුම්පත් ගාස්තු ආවරණය කිරීම.
පර්යේෂණ ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා ඒවායේ ප්‍රතිඵලවල තාක්ෂණික සූදානම මට්ටම (TRL) වැඩි කිරීමට සහ UBL ප්‍රදානයෙන් අරමුදල් මුදා හැරීමට අරමුදල් අවශ්‍ය වේ.	වාණිජකරණය කළ හැකි විභවයන් සහිත පර්යේෂණ ව්‍යාපෘති හඳුනා ගැනීමට තොරතුරු රැස් කිරීම. තාක්ෂණික සූදානම මට්ටම (TRL) වැඩිදියුණු කිරීම සඳහා අරමුදල් නිකුත් කිරීම සඳහා ලෝක බැංකු අනුමැතිය ලබා ගැනීම සහ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අධීක්ෂණය කිරීම සහ අවසානයේ දියුණු තාක්ෂණය මාරු කිරීමට පහසුකම් සැලසීම.

දිගු කාලීනව ස්වයංපෝෂිත UBL සැලසුම් කිරීම	**අරමුදල් උත්පාදනය කිරීම සඳහා නව ක්‍රියාකාරකම් හඳුනා ගැනීම.**
IP බුද්ධිමය දේපල ප්‍රතිපත්තිය, බලපත්‍ර තාක්ෂණය, පේටන්ට් බලපත්‍ර අයදුම් කිරීම සහ පෙර කලා සෙවීම් පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා වැඩමුළු සංවිධානය කිරීම.	පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර සහ බුද්ධිමය දේපල අයිතිවාසිකම් (පේටන්ට් බලපත්‍ර, කාර්මික සැලසුම්, වෙළඳ ලකුණු) සඳහා අයදුම් කිරීමට Prior Art සෙවීම් දිරිමත් කිරීම සඳහා දැනුවත් කිරීම. webinars හරහා විශ්වවිද්‍යාල IP බුද්ධිමය දේපල ප්‍රතිපත්ති සහ UBL ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්.
e-commerce විසඳුමක් නිර්මාණය කළ හැකි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ පොදු ප්‍රවේශයට මාරු කිරීමට සහාය වීම	කර්මාන්තය සමඟ සම්බන්ධීකරණය සහ මහජන ප්‍රජාවගේ අවශ්‍යතා හඳුනා ගැනීම සහ ගැටලුව විසඳීම සඳහා උපාධි හෝ පශ්චාත් උපාධි පර්යේෂණ ව්‍යාපෘති සම්බන්ධ කිරීම.

19.7.4 වෙනත් උද්දීපනය කළ සිදුවීම්

- කාර්මික හවුල්කරුවන් සමඟ සම්බන්ධතාව වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය විසින් හෙරලියවල කර්මාන්තපුරය වෙත කාර්මික සංචාරයක් සංවිධානය කරන ලදී.
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ (NEDA) සභාපති WUBIC සහ NEDA සහයෝගිතාව දිගටම කරගෙන යාමට WUBIC වෙත ගියේය.

- ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ සුපිරි වෙළඳසැල්වල ගැනුම් ප්‍රධානීන් සමඟ රැස්වීමක්. ගරු විමල් වීරවංශ ඇමති තුමා, IDB සභාපති තුමා, සතොස සභාපති තුමා, පාරිභෝගික කටයුතු අධිකාරියේ සභාපති තුමා" Cargill's" Keels" Laughs හි මිලදී ගැනීමේ ප්‍රධානීන් සමග කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ දී හමුවක් පැවැත්වීම.
- කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් හමුවීම. NEDA හි අධ්‍යක්ෂ තුමා ද සහභාගී විය. වයඹ විශ්වවිද්‍යාල ව්‍යාපාර ප්‍රවර්ධන මධ්‍යස්ථානයේ ව්‍යවසායකත්ව ක්‍රියාකාරකම් පිළිබඳ සාකච්ඡා කෙරිණ.
- වයඹ විශ්වවිද්‍යාලය විසින් දියුණු කරන ලද තාක්ෂණය වාණිජකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ ව්‍යවසායකයකු වන හැරී ජයවර්ධන මහතා හමුවීම.

19.7.5 2021 වර්ෂයේ දී තාක්ෂණ හුවමාරුව

තාක්ෂණය	බලපත්‍ර ලැබීමට නියමිත
ඖෂධීය තේ	වාණිජ අනුග්‍රාහකයෙකු බලාපොරොත්තු වේ
Tea Crunch	වාණිජ අනුග්‍රාහකයෙකු බලාපොරොත්තු වේ
තේ පදනම් කරගත් අත් සේදුම්	වාණිජ අනුග්‍රාහකයෙකු බලාපොරොත්තු වේ
ඖෂධීය ක්ෂණික තේ	වාණිජ අනුග්‍රාහකයෙකු බලාපොරොත්තු වේ
කාබනික ශක්තිජනක පානය	වාණිජ අනුග්‍රාහකයෙකු බලාපොරොත්තු වේ
කඩදාසි සබන්	වාණිජ අනුග්‍රාහකයෙකු බලාපොරොත්තු වේ
Aquarium Bio balls	වාණිජ අනුග්‍රාහකයෙකු බලාපොරොත්තු වේ
පළතුරු ඉදවීමේ කුටිය සහ පුවරු	වාණිජ අනුග්‍රාහකයෙකු බලාපොරොත්තු වේ
තෙතමනය අවශෝෂක කඩදාසි	වාණිජ අනුග්‍රාහකයෙකු බලාපොරොත්තු වේ
Ready to Serve ටින් කළ කැඳ වර්ග සහ ඔසු පැන්	වාණිජ අනුග්‍රාහකයෙකු බලාපොරොත්තු වේ

20. 2020 වර්ෂයේ ගිණුම්

20.1 පුනරාවර්තන වියදම් තොරතුරු
20.2 ප්‍රාග්ධන වියදම් තොරතුරු
20.3 මූල්‍ය ප්‍රගතිය තොරතුරු (වියදම්)
20.4 මූල්‍ය ප්‍රගතිය තොරතුරු (උපයන ලද ආදායම්)
20.5 මූල්‍ය ක්‍රියාකාරීත්වය විශ්ලේෂණය - 2020
20.6 2016 - 2020 ඒක ශිෂ්‍ය පිරිවැය
20.7 2020 වර්ෂයේ ලද යටිතල පහසුකම් තොරතුරු
20.8 ව්‍යාපෘති වියදම් තොරතුරු (දේශීය අරමුදල්) - 2020

20.1 පුනරාවර්තන වියදම් තොරතුරු

විෂය	2019 රු.	2020 රු.
අ. පුද්ගල වැටුප් හා චේතන	1,344,674,849	1,418,571,084
ආ. ගමන් වියදම්	799,977	326,360
ඇ. සැපයීම්	46,991,492	31,760,093
ඈ. නඩත්තු	18,494,246	15,044,306
ඉ. කොන්ත්‍රාත් සේවා	180,090,930	139,561,417
ඊ. වෙනත්	41,327,500	30,891,107
එකතුව	**1,632,378,994**	**1,636,154,367**

20.2 ප්‍රාග්ධන වියදම් තොරතුරු

විෂය	2019 රු.	2020 රු.
අ. පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම්	68,012,769	43,458,523
ආ. වත්කම් අත්පත්කර ගැනීම්	116,397,651	29,940,620
ඇ. ඉදිකිරීම් ව්‍යාපෘති	66,673,012	87,964,059
ඈ. වෙනත් ප්‍රාග්ධන ප්‍රධාන	896,212,253	660,374,662
එකතුව	**1,147,295,685**	**821,737,864**

20.3 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (වියදම්)

විෂය	2020 වර්ෂයේ ප්‍රතිපාදන රු.	2020 වර්ෂය වියදම රු.	ඉතිරිය /හිඟය රු.
අ. පුනරාවර්තන (ව්‍යාපෘති හැර)	1,595,500,000	1,636,154,367	(40,654,367)
ආ. ප්‍රාග්ධන (ව්‍යාපෘති හැර)	857,000,000	821,737,864	33,262,136
එකතුව	**2,452,500,000**	**2,457,892,231**	**(5,392,231)**

20.4 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (උපයන ලද ආදායම්)


ආදායම් ප්‍රභවය	2020 වර්ෂයේ එකතුව රු.
අ. උපාධිඅපේක්ෂක අධ්‍යයන	23,787,000
ආ. පශ්චාද් උපාධි අධ්‍යයන	39,989,450
ඇ. උපදේශන	-
ඈ. අනෙකුත්	21,808,007
එකතුව	**85,584,457**

20.5 මූල්‍ය ක්‍රියාකාරීත්ව විශ්ලේෂණය 2020

විෂය	සමීකරණය	එක් ශිෂ්‍යයෙකු සඳහා වියදම රු.
අ. ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම (RE)	ශිෂ්‍ය පුනරාවර්තන වියදම් ශිෂ්‍ය සංඛ්‍යාව	338,889
ආ. ඒක ශිෂ්‍ය ප්‍රාග්ධන වියදම් (CE)	ශිෂ්‍ය ප්‍රාග්ධන වියදම් ශිෂ්‍ය සංඛ්‍යාව	170,202
එකතුව		**509,091**

20.6 2016 - 2020 තුළ ඒක ශිෂ්‍ය පිරිවැය පීඨ මට්ටමින් (මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් ද ඇතුළුව)

පීඨය	2016	2017	2018	2019	2020
කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය	470,620.67	506,440.00	490,862.26	540,372.25	467,090.91
ව්‍යවහාරිකවිද්‍යා පීඨය	475,765.32	475,217.00	549,859.29	658,761.55	650,758.68
ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය	299,503.71	333,602.10	332,053.95	366,804.19	330,071.35
පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය	552,471.34	622,529.89	628,017.33	749,292.36	641,215.30
තාක්ෂණ පීඨය	-	-	394,210.35	402,444.38	398,676.34
වෛද්‍ය පීඨය	-	-	394,644.66	909,502.95	620,204.81



20.7 2020 වර්ෂයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති

යටිතල පහසුකම් තොරතුරු	වියදම රු.	ඇස්තමේන්තුගත ව්‍යාපෘති කාලය	භෞතික ප්‍රගතිය
වෛද්‍යපීඨය සැලසුම් කිරීම සහ ඉදිකිරීම ලබුයාය පරිශ්‍රය	2,000,876,123.00	2017 අගෝස්තු සිට 2019 අගෝස්තු දක්වා සංශෝධිත වැඩ නිමවීම 2020 ජනවාරි	100%
කුලියාපිටිය පරිශ්‍රයේ පවුල් නේවාසිකාගාර අදියර 02 ඉදිකොට නිම කිරීම	26,511,906.25	2019 දෙසැම්බර් සිට 2020 සැප්තැම්බර් දක්වා සංශෝධිත වැඩ නිමවීම 2020 පෙබරවාරි	50%
මාකඳුර පරිශ්‍රයේ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ පීඨ ගොඩනැඟිල්ලේ දිගුව සැලසුම් කිරීම සහ ඉදි කිරීම	200,579,800	2019 අප්‍රේල් සිට 2020 ඔක්තෝබර් දක්වා සංශෝධිත වැඩ නිමවීම 2021 පෙබරවාරි	40%
කුලියාපිටිය පරිශ්‍රයේ තාක්ෂණ පීඨයේ දෙවන අදියර සැලසුම් කොට ඉදිකිරීම	1,560,361,055	2020 අගෝස්තු 2022 අගොස්තු දක්වා	4%

වාර්ෂික ගිණුම් ප්‍රකාශන

2020

1971 අංක 38 දරණ මුදල් පනතේ 13(6) ජේදයේ ප්‍රකාර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික ගිණුම් ප්‍රකාශන පිළිබඳ ව්‍යවස්ථාපිත වාර්තාව

1. මෙම මූල්‍ය ප්‍රකාශය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106(1) සහ 107(බී) ජේදයන්ට හා කලින් කල නීතිගත කරන ලද සංශෝධනවලට හා 1971 අංක 38 දරණ මුදල් පනතට අනුව පිළියෙල කොට ඉදිරිපත් කරනු ලැබේ.

(i) ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා අර්ථ නිරූපණය කිරීම සංගතතාවක් පවත්වා ගනිමින් හා රාජ්‍ය අංශයේ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේ දී සාමාන්‍යයෙන් පිළිපදිනු ලබන පොදුවේ පිළිගත් පරිචයන්ට අනුකූලව මෙම ගිණුම් අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සිදු කොට ඇත.

අ. මූල්‍ය හෙලිදරව්ව

(1) රජයේ ප්‍රතිපාදන

	2019	2020
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන (මහා භාණ්ඩාගාරයෙන්)	1,455,750,000	1,595,500,000
මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා රජයේ ප්‍රතිපාදන	29,225,200	-
ශිෂ්‍යාධාර ගෙවීම් සඳහා රජයේ ප්‍රතිපාදන	27,665,200	34,257,000
මූලධන 101 - පුනරුත්තාපන වැඩසටහන	64,150,000	47,882,000
මූලධන 102 වත්කම් අත්පත් කර ගැනීම	100,000,000	52,500,000
මූලධන 103 ඉදිකිරීම් ව්‍යාපෘති	71,800,000	79,118,000
වෙනත් මූලධන ප්‍රතිපාදන (මහා භාණ්ඩාගාරය)	7,000,000	2,500,000
වෙනත් විශේෂ ප්‍රතිපාදන (වි.වි.ප්‍ර.කොා.ස)	672,000,000	675,000,000
වෙනත් විශේෂ ප්‍රතිපාදන (AHEAD)	252,000,000	-
එකතුව	**2,679,590,400**	**2,486,757,000**

බාහිර පාඨමාලා සහ වෙනත් ප්‍රතිපාදන

පශ්චාද් උපාධි පාඨමාලා		**2019**	**2020**
ව්‍යාපාර පරිපාලන විද්‍යාපති පාඨමාලාව – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය	**රු.**	10,017,250	17,893,000
පශ්චාද් උපාධි ඩිප්ලෝමා - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය	**රු.**	15,897,250	13,536,450
කෘෂි ව්‍යාපාර හා තාක්ෂණ කළමනාකරණ විද්‍යාපති උපාධිය	**රු**	-	8,560,000
බාහිර උපාධි පාඨමාලා			
වැවිලි කළමනාකරණ පාඨමාලාව – මාකඳුර	**රු.**	24,912,675	23,649,000
අහාර තත්ව කළමනාකරණ භාහිර උපධි පාඨමාලාව	**රු**	-	138,000
ඩිප්ලෝමා පාඨමාලා			
ඉංග්‍රීසි ඩිප්ලෝමාව	**රු.**	1,217,841	282,000
රක්ෂණ ඩිප්ලෝමාව – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය	**රු.**	90,000	-
රක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව	**රු.**	8,500	-
තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව	**රු.**	4,944,000	3,927,500
මෘදුකාංග පිළිබඳ ඩිප්ලෝමාව	**රු.**	312,935	5,190,800
අහාර ව්‍යාපාර හා අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව	**රු.**	1,371,500	122,500
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	**රු.**	1,832,000	933,000
ඉගැන්වීමේ ක්‍රම සහ අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව	**රු.**	745,250	150,750
තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව - මාකඳුර	**රු**	-	1,056,000
ඉගැන්වීමේ ක්‍රම සහ අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමාව			56,000
මෘදුකාංග ඉංජිනේරු පිළිබඳ උසස් ඩිප්ලෝමාව	**රු**		1,991,000
සහතික පත්‍ර පාඨමාලා			
බාහිර පරිගණක පාඨමාලා – මාකඳුර	**රු.**	1,448,000	600,000
පර්යේෂණ ප්‍රතිපාදන			
NSF ප්‍රතිපාදන	**රු.**	6,966,515	374,936
CARP ව්‍යාපෘති	**රු.**	122,500	-
Scale – up and Mapping	**රු.**	-	4,379,446
Main Streaming Nutrition into Agriculture	**රු.**	-	2,744,075
එකතුව	**රු.**	**71,775,916**	**85,584,457**

2. 2020 වර්ෂයේ වියදම මත ආදායම් අතිරික්තය රු 68,492,160.00 ක් විය මෙය 2019 වර්ෂයේ දී රු 205,502,778.00 ක් විය.
3. මෙම විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතු වූවන් සඳහා ගෙවන ලද ණය සහ අත්තිකාරම් මඟින් ඉතිරිය අයවිය යුතුය. එහි අගය රු 53,549,142.00 කි. මෙය 2019 වර්ෂයේ දී රු 52,356,940.00 ක් විය.
4. විශ්වවිද්‍යාලය මගින් අනුමැතිය නොලත් ආයෝජනය කරන ලද මුදල්වල අගය ශේෂ පත්‍රය සකසන අවස්ථාව වන විට රු 185,325,239.00 කි. මෙය 2019 වර්ෂයේ දී රු 176,717,265.00 කි.

5. අභ්‍යන්තර ආදායම් ප්‍රභව

2019 Rs.	2020 Rs.	වෙනස Rs.	වෙනස ප්‍රතිශතයක් ලෙස %
30,442,138.00	23,984,471	(6,457,667.00)	(21.2%)

a. ශේෂ පත්‍රයේ දැක්වෙන අන්දමට විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම්වල අවසන් ශේෂය අදාළ මුදල් පොත් සමග ප්‍රත්‍යාගණනය කොට ඇත. අදාළ බැංකු මගින් ඔවුන්ගේ අගයන් සනාථ කොට විගණකාධිපති වෙත දැනුම් දෙන ලෙස දන්වනු ලැබ ඇත. මෙම අගයන් කෙටි කාලීන ගනු දෙනුවලට සමානව පවතී.
b. ශේෂ පත්‍රයේ සඳහන් තොග අගය රු 29,808,151.00 කි. මෙහි අගය සනාථ කළ යුත්තේ හිමිකම පවත්නා තොග අගය මතය. ප්‍රත්‍යාගණනය කරන ලද තොග අගයන් ගිණුම් ගත කොට ඇත.
c. ශේෂ පත්‍රයේ දැක්වෙන පරිදි කෙරෙමින් පවතින වැඩවල මූල්‍ය අගය 160,625,649.00 කි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව කෙරෙමින් පවතින වැඩ ඉදිරියට ගෙන ඇත.
d. 2020 සාමාන්‍ය ශේෂය රු 277,131,706.00 කි. මෙය 2019 වර්ෂය හා සසඳන කල රු 279,199,989.00 කි. මෙය ක්ෂය කිරීම් මත පදනම් වී ඇත.
   කෙසේ වුවද 2019 වර්ෂයේ ක්ෂය ගිණුමෙහි මෙය දැක්විය යුතුය. වාර්ෂික ගිණුම්වල ක්ෂයවීම් ගැලපීම පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 649 (1995 ඔක්තෝබර් 05 දිනැති) හි සඳහන් වෙයි. සලකා බලන වර්ෂයේ අගයන් ඒ මත පදනම් වෙයි.
   2020 වර්ෂයේ සමස්ත ක්ෂය අගය රු 488,103,047.00 කි.

e. 2020 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම යාමේ දී ගෙවනු ලබන පාරිතෝෂික ගෙවීමේ අගය රු 351,510,828.00 කි. මේවා පාරිතෝෂික පනතේ විධිවිධාන ප්‍රකාර වේ. මේ හා සමාන ආයෝජන දක්නට නොලැබේ.

ආ. <u>අය වැය පාලනය</u>

ගත වූ වර්ෂය තුළ ඵලදායී මූල්‍ය කළමනාකරණ මෙවලමක් ලෙස අය වැය වැඩසටහන යොදා ගන්න ලදී.

<u>ඇ. ගිණුම් ප්‍රත්‍යාගණනය</u>

සියලු පාලන ගිණුම් ප්‍රත්‍යාගණනය කොට ඇති අතර තොරතුරු ලේඛන සකසා මූල්‍ය ප්‍රකාශය සමග ඉදිරිපත් කෙරේ

<u>සාමාන්‍ය</u>

අවසන් වශයෙන් ප්‍රකාශ කළ හැක්කේ විශ්වවිද්‍යාලය ගැටලු කිහිපයකට මුහුණපෑම හේතුවෙන් මිල ගණන් වෙනස් වීම් සහ විවිධ පාලනය කළ නොහැකි තත්වයන් 2020 තුළ දක්නට ලැබුණු බවයි. කෙසේ වෙතත් ඒ සියලු බාධාවන් නොසලකා විශ්වවිද්‍යාලය තම ඉලක්කයන් කරා සාර්ථක අන්දමින් මෙහෙය වීම සඳහා අධ්‍යයන අනධ්‍යයන සහ උසස් අධ්‍යාපන වැඩසටහන් 2020වර්ෂය තුළ ක්‍රියාත්මක විය.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ ජයසිංහ
උපකුලපති
2021.02.16

★★★මෙහි අත්සන් කරන ලද ගිණුම් ඉංග්‍රීසි පිටපතෙහි ඇත.

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය

		2019 දෙසැම්බර් 31 දිනට		2020 දෙසැම්බර් 31 දිනට	
වත්කම්					
ජංගම වත්කම්	**සටහන**				
බැංකු ගිණුම් ශේෂය	**1**	178,775,949		235,797,280	
ඉතිරිකිරීම් තැන්පත්	**2**	5,262,197		3,561,233	
වෙළඳ හා වෙනත් ලැබීම්	**3**	4,211,238		2,494,277	
වට්ටෝරුගත/ ගබඩාගත තොග	**4**	32,462,258		29,808,151	
ඉදිරියට කළ ගෙවීම්		2,692,876		2,030,246	
කාර්යය මණ්ඩල අත්තිකාරම්	**5**	129,550		673,800	
මූලධන අත්තිකාරම්	**6**	73,278,026		377,021,604	
සේවා සහ සැපයුම් සඳහා අත්තිකාරම්	**7**	2,980,083		628,378	
අනෙකුත් ජංගම වත්කම්	**8**	13,949,937		32,485,037	
		313,742,113		684,500,006	
ජංගම නොවන වත්කම්					
දිගුකාලීන ආයෝජන	**9**	176,717,265		185,325,239	
දේපල, පිරියත සහ උපකරණ	**10**	5,772,768,308		8,996,947,344	
නොනිමි වැඩ	**11**	2,979,574,730		160,625,649	
කාර්ය මණ්ඩල ණය	**12**	52,356,940		53,549,142	
		8,981,417,243		9,396,447,375	
වත්කම්වල එකතුව		9,295,159,356		10,080,947,381	
වගකීම්					
ජංගම වගකීම්					
විවිධ ණය හිමියෝ	**13**	242,531,066		173,571,926	
තැන්පත්	**14**	1,725,179		1,175,854	
වියදම් ණය හිමියෝ	**15**	55,170,833		42,359,362	
වෙනත්	**16**	288,839,057		448,782,382	

		588,266,134		665,889,525	
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික වෙන්කිරීම්	**17**	313,507,677		351,510,828	
		313,507,677		351,510,828	
වගකීම්වල එකතුව		**901,773,811**		**1,017,400,353**	
ශුද්ධ වත්කම්වල එකතුව		**8,393,385,545**		**9,063,547,028**	
ඒකාබද්ධ අරමුදල		279,199,989		(277,131,706)	
සංචිත		1,416,645,179		1,366,667,647	
මූලධන - වැය වූ මූලධන ප්‍රතිපාදන	**18**	1,567,937,753		5,037,093,375	
මූලධන - වැය වූ ප්‍රතිපාදන / නොනිමි වැඩ	*	2,979,574,730		-	
වැය නොවූ මූලධන ප්‍රතිපාදන	**19**	81,946,192		119,083,720	
විශේෂ ප්‍රතිපාදන සහ ප්‍රදාන	**20**	2,472,351,224		2,631,003,254	
		8,239,255,089		**8,876,716,291**	
පාඨමාලා සංවර්ධන අරමුදල	**21**	81,928,879		99,305,635	
පරිත්‍යාග අරමුදල්	**22**	1,497,153		1,556,421	
විශේෂ අරමුදල්	**23**	70,704,424		85,968,681	
		154,130,456		**186,830,737**	
ශුද්ධ වත්කම්/ කොටස්වල එකතුව		**8,393,385,545**		**9,063,547,028**	

(*) වැය කරන ලද ප්‍රදානය - 2020 දෙසැම්බර් 31 වන දිනට රු 160,625,649 ක් ප්‍රගතියේ පවතින වැඩ ප්‍රාග්ධන ප්‍රදානයට ඇතුළත් වේ

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනත අනුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශයේ ආයතනවල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශය සකසා ඇති බව මූල්‍යාධිකාරීවරයා සහතික කරයි.

(ඩී. ඒ. යූ. ධර්මදාස මයා)
මූල්‍යාධිකාරී
2020.02.16

★★★මෙහි අත්සන් කරන ලද ගිණුම් ඉංග්‍රීසි පිටපතෙහි ඇත.

විශ්වවිද්‍යාල පාලක සභාව මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන 2021 පෙබරවාරි 23 දින විශ්වවිද්‍යාල පාලක සභාව වෙනුවෙන් එහි සභාපතිවරයාගේ බලතල ප්‍රකාරව නිකුත් කරන ලදී.

(ඡ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ ජයසිංහ මහතා)
උපකුලපති
සභාපති - පාලක සභාව

(ඩබ්. ඒ. ඩී. චිත්‍රානන්ද මයා)
ලේඛකාධිකාරී
ලේකම් – පාලක සභාව

පාලක සභාව වෙනුවෙන් අත්සන් තබන ලදී.

ඩබ් ඒ යූ විජේසිංහ මහතා
පාලක සභා සාමාජික

සුපුන් අධිකාරි මයා
පාලක සභා සාමාජික

★★★මෙහි අත්සන් කරන ලද ගිණුම් ඉංග්‍රීසි පිටපතෙහි ඇත.

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය

	මෙම වර්ෂය 2020	පසුගිය වර්ෂය 2019
මෙහෙයුම් ආදායම		
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන	1,595,500,000	1,455,750,000
ශිෂ්‍යාධාර සඳහා රජයේ ප්‍රතිපාදන	34,257,000	27,665,200
මහපොළ ශිෂ්‍යත්ව සඳහා රජයේ ප්‍රතිපාදන	-	29,225,200
භාරකාර ශිෂ්‍යත්ව සඳහා ප්‍රතිපාදන	-	4,000
පුනරාවර්තන ප්‍රතිපාදන (පුනරුත්තාපන ස්වභාවයේ)	22,623,084	27,937,820
රජයේ ප්‍රතිපාදන හා පරිත්‍යාග	436,280,783	405,464,896
ආයෝජන පොලිය	7,001,651	7,762,723
කාර්ය මණ්ඩල ණය පොලිය	2,092,011	2,169,081
දේපල කුලිය	1,799,442	2,327,502
පැරණි භාණ්ඩ අලෙවිය	-	2,284,735
ඵලදා විකිණීම	311,482	528,367
විවිධ ලැබීම් (සටහන 25)	9,826,438	15,323,750
ලියාපදිංචි ගාස්තු (උපාධි අපේක්ෂකයින්)	2,159,130	1,837,045
විභාග ගාස්තු (උපාධි අපේක්ෂකයින්)	133,690	137,660
පුස්තකාලයීය දඩ	660,628	71,275
මෙහෙයුම් ආදායම් එකතුව	**2,112,645,338**	**1,976,489,253**
මෙහෙයුම් වියදම (ක්ෂයවීම් ඇතුළුව)		
පුද්ගල වැටුප් හා වේතන (සටහන 26)	1,418,571,084	1,344,674,879
ගමන් වියදම්	326,360	799,977
සැපයුම් හා පාරිභෝජන	31,760,093	46,991,492
නඩත්තු	15,044,306	18,494,246
ගිවිසුම්ගත සේවා	139,561,417	180,090,930
ක්ෂයවීම්	488,103,047	464,780,818
අනෙකුත් මෙහෙයුම් වියදම්	30,891,107	41,327,500

මහපොළ හා ශිෂ්‍යාධාර ගෙවීම්	34,257,000	56,894,400
පුනරුත්ථාපන වියදම් (පුනරාවර්තන ස්වභාවයේ)	19,245,839	22,044,164
පර්යේෂණ වියදම් (පුනරාවර්තන ස්වභාවයේ)	3,377,245	5,893,656
සමස්ත මෙහෙයුම් වියදම	**2,181,137,498**	**2,181,992,032**
ශුද්ධ අතිරික්තය (ඌනතාව) ගත වූ කාලය තුළ	**(68,492,160)**	**(205,502,778)**

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2020 දෙසැම්බර් 31 දිනට රු	2019 දෙසැම්බර් 31 දිනට රු
මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය		
අතිරික්තය/(ඌනතාව) සාමාන්‍ය ක්‍රියාකාරීත්වය	68,492,160	205,502,778
එකතු කිරීම්: සංචලනය නොවන මුදල්		
ක්ෂය	488,103,047	464,780,818
පාරිතෝෂික වෙන්කිරීම්	52,356,369	160,970,932
පාරිතෝෂික ගෙවීම්	14,353,218	6,664,325
පෙර වර්ෂයේ ගැලපීම් - පෙර වර්ෂය වෙනුවෙන් ලද ආදායම්	1,118,983	-
පෙර වර්ෂයේ ගැලපීම් - පෙර වර්ෂය වෙනුවෙන් කළ ගෙවීම්	8,679,514	3,286,356
නැවත තක්සේරු කිරීම මත ගැලපීම	1,844,732	23,088,016
රජයේ ප්‍රතිපාදන හා පරිත්‍යාග	436,280,783	(405,464,896)
තොගයේ වැඩිවීම්/අඩුවීම්	2,654,107	4,070,315
වෙනත් ලැබීම් වැඩිවීම් අඩුවීම්	1,716,961	(2,835,485)
කාර්ය මණ්ඩල ණය වැඩිවීම්/අඩුවීම්	1,192,202	1,754,614
කාර්ය මණ්ඩල අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම්	544,250	(1,450)
සැපයුම් සහ සේවා අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම්	2,351,705	(2,582,970)
ඉදිරියට කළ ගෙවීම් වැඩිවීම්/අඩුවීම්	662,630	518,469
ප්‍රාග්ධන අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම්	303,743,577	185,919,538
අනෙකුත් ජංගම වත්කම් වැඩිවීම්/අඩුවීම්	18,535,101	(3,241,215)
විවිධ ණයහිමියෝ වැඩිවීම්/අඩුවීම්	68,959,139	1,135,135
තැම්පත් වැඩිවීම්/අඩුවීම්	549,324	279,979
වියදම් ණයහිමියෝ වැඩිවීම්/අඩුවීම්	12,811,471	4,053,792
අනෙකුත් ජංගම වගකීම් වැඩිවීම්/අඩුවීම්	159,943,325	11,086,343
ශුද්ධ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය	**(208,267,820)**	**234,651,187**
පිරියත හා උපකරණ මිලදී ගැනීම්	3,174,665,472	(523,145,172)

සීමිත අරමුදල් ආයෝජන	8,607,974	(13,986,111)
කාර්ය ප්‍රගතිය	2,566,949,081	(835,727,713)
ඉතුරුම් තැන්පතු	59,269	11,473
ශුද්ධ ආයෝජන ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය	616,265,097	(1,372,847,524)
මූල්‍ය ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය		
මූලධන ප්‍රතිපාදන - පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම්	47,882,000	64,150,000
මූලධන ප්‍රතිපාදන - වත්කම් අත්පත්කර ගැනීම්	52,500,000	100,000,000
මූලධන ප්‍රතිපාදන - ස්ථිර ඉදිකිරීම්	79,118,000	71,800,000
මූලධන ප්‍රතිපාදන වෙනත්	2,500,000	7,000,000
මූලධන ප්‍රතිපාදන වි වි ප්‍ර කො ස	675,000,000	672,000,000
මූලධන ප්‍රතිපාදන AHEAD	-	252,000,000
වෙනත් ප්‍රතිපාදන - බාහිර වැඩසටහන්	12,357,044	5,353,302
මූලධන ප්‍රතිපාදන වෙනත්	478,311	5,635,532
විශේෂ ලැබීම්	15,264,258	8,446,667
පාඨමාලා සංවර්ධන අරමුදල	17,376,756	26,539,483
පුනරාවර්තන ස්වාභාවයේ ප්‍රාග්ධන ප්‍රදාන	(22,623,084)	(27,937,820)
ශුද්ධ මූල්‍ය ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය	879,853,284	1,184,987,164
ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)	**55,320,367**	**46,790,828**
	184,038,146	**137,247,318**
	239,358,513	**184,038,146**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන

අ) මුදල් හා මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් සහ සමාන දෑ යටතට ගැනෙනුයේ අත ඇති මුදල් හා බැංකු ගිණුම්වල ඇති තැම්පත් ශේෂයන්ය. පහත සඳහන් බැංකු ගිණුම් වලට අදාල ශේෂයන් මීට අයත් වේ.

මුදල් සහ මුදල් සමාන දෑ පිළිබඳ විශ්ලේෂණය	2020 දෙසැම්බර් 31 දිනට	2019 දෙසැම්බර් 31 දිනට
මහජන බැංකුව කුලියාපිටිය - ගි. අ. 028100151586123	15,567,004	13,146,757
මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100120000171	30,851,124	37,967,101
මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100140000165	1,802,217	771,559
ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0002874770	28,125,069	4,672,686
ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 00001473507	1,036,265	13,273,855
ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0001473508	18,249,236	9,073,251
ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0001473388	116,867,967	80,158,873
මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100120000963	7,066,464	7,839,889
මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100130041538	777,416	614,252
මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100140044857	12,347,952	9,470,407
මහජන බැංකුව මාකඳුර - ගි. අ. 137100230000165	2,215,753	1,787,319
ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 00085705517	890,813	-
එකතුව	235,797,280	178,775,949
ඉතුරුම් තැම්පතු - මහජන බැංකුව කුලියාපිටිය 001 - 3 - 1548782	443,879	427,331
සම්පත් බැංකුව - කුලියාපිටිය 102361000585	-	1,761
ලංකා බැංකුව කුලියාපිටිය 76183365	999,750	665,780
ලංකා බැංකුව කුලියාපිටිය 76183353	158,205	517,749
ලංකා බැංකුව කුලියාපිටිය 76183339	82,448	332,327
ලංකා බැංකුව කුලියාපිටිය 76183268	384,838	255,308
ඉතුරුම් තැම්පතු - මහජන බැංකුව කුලියාපිටිය 028200131586123	643,705	669,898
ඉතුරුම් තැම්පතු - මහජන බැංකුව කුලියාපිටිය 137-2001-1-0000171	509,005	1,213,504
ඉතුරුම් තැම්පතු - මහජන බැංකුව කුලියාපිටිය 137-2002-1-0044857	162,881	560,093
ඉතුරුම් තැම්පතු - මහජන බැංකුව කුලියාපිටිය 137-2002-0-0041538	33,714	29,272
ඉතුරුම් තැම්පතු - මහජන බැංකුව කුලියාපිටිය 137-2001-2-0044857	121,893	589,174
ලංකා බැංකුව කුලියාපිටිය් 85623021	20,916	-
	3,561,233	**5,262,197**

සමස්ත මූල්‍ය හා මුදල් හා සමාන දෑ	**239,358,513**	**184,038,146**
දේපල් යන්ත්‍ර හා උපකරණ		
අදාළ කාලසීමාවේ එකතුවීම් පහත පරිදි වේ		
රජයේ ප්‍රදාන – මූලධන	**3,174,665,472**	**523,145,172**
විශේෂ ප්‍රදාන		
ප්‍රදාන – නේවාසිකාගාර	**-**	**733,741,516**
ප්‍රදාන - AHEAD	259,545,116	94,251,271
ප්‍රදාන AHEAD ගොඩනැගිලි	261,952,575	-
ප්‍රදාන NRC	2,832,100	
ප්‍රදාන Sathuta Builders	1,138,960	
වෙනත් ප්‍රදාන	921,775	
ප්‍රදාන පුස්තකාල පොත්	48,434	7,112,683
	526,438,960	**835,105,470**
සමස්ත එකතුව	**3,701,104,432**	**1,358,250,642**

තිරසාර සංවර්ධන යෝජනා

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

තිරසාර සංවර්ධන යෝජනා - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

1 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පීඨ 06ට වසරකට සිසුන් 1500ක් පමණ ඇතුලත් කරගනු ලබයි. එසේ ම එම පීඨ මඟින් වාර්ෂිකව උපාධිධාරීන් 900ක් පමණ පිටවන අතර රටේ ආර්ථික වර්ධනයට අවශ්‍ය ශ්‍රම දායක්වය ලබා දෙන උපාධිධාරීන් පිරිසක් වයඹ විශ්වවිද්‍යාලය මඟින් බිහි කරනු ලබයි. එමඟින් ලංකාවේ දිළිඳුකම තුරන් කිරීමට අවශ්‍ය ශ්‍රම දායකත්වය ලබා දීමට විශ්වවිද්‍යාලයට හැකි වේ.

2 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රයේ පිහිටි කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨය හා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය මඟින් විවිධ පර්යේෂණ සිදු කරන අතර ඒ මඟින් විවිධ බෝග වර්ග හා ආහාර වර්ග හඳුන්වා දීම මඟින් රටේ දරිද්‍රතාව තුරන් කිරීම සඳහා පිටුවහලක් ලබා දේ.

3 ලංකාවේ 10 වන වෛද්‍ය පීඨය ලෙස ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ආරම්භ කරනු ලැබූ අතර ඒ සඳහා මේ වන විට කාණ්ඩ 02ක් සඳහා සිසුන් 150ක් බඳවා ගන්නා ලදි. එසේ ම කුලියාපිටිය මූලික රෝහල ශික්ෂණ රෝහලක් බවට පත් කළ අතර ඊට අමතරව මහාචාර්ය ඒකකයක් ද පිහිටුවීමට කටයුතු කරනු ලැබේ. එසේ ම වෛද්‍ය පීඨයේ දෙපාර්තමේන්තු 15ක් ඇති අතර රටේ සෞඛ්‍ය තත්වය දියුණු කිරීමට අවශ්‍ය වෛද්‍යවරුන් බිහි කිරීමට අවශ්‍ය පහසුකම් විශ්වවිද්‍යාලය මඟින් සැපයීම මෙහි අරමුණයි.

4 සංවර්ධනය වන රටක් වන ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය දියුණු කිරීමට උසස් අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩි කිරීමට තත්ව ආරක්ෂණ වැඩ සටහන් මඟින් (Quality Assurance) ඉහළ මට්ටමේ අධ්‍යාපනයක් සිසුන්ට ලබා දීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ. එසේ ම විශ්වවිද්‍යාලයේ තත්ව ආරක්ෂණ ඒකකයක් ද (Quality Assurance Unit) පිහිටුවා ඇත. එසේ ම සිසුන්ට අවශ්‍ය තාක්ෂණය හා රැකියා අභිමුඛ පුහුණුවට යොමු කර ඒ තුළින් හොඳ අධ්‍යාපන තත්වයක් ලබා දීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ.

5 විශ්වවිද්‍යාලය මඟින් සංවිධානය කරනු ලබන සෑම කටයුත්තකදී ම ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සැමට සමාන අයිතිවාසිකම් ලැබෙන ලෙස කටයුතු කරනු ලැබේ.

6 සනීපාරක්ෂාව හා ජල පහසුකම් ලබා දීමේ දී විශ්වවිද්‍යාලය පරිභෝජනය සඳහා අවශ්‍ය සියලුම ජලය නළ ළිං මාර්ගයෙන් ලබා ගන්නා අතර සිසුන්ට හා කාර්යය මණ්ඩලයේ පාවිච්චියට ගත හැකි අයුරින් ජලය පිරිපහදු කර ලබා දෙනු ලැබේ. එසේ ම මෙම ජලයේ තත්වය පිළිබඳව නිතරම පරීක්ෂා කරනු ලැබේ. විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානය, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, පවිත්‍රතා අංශය, උද්‍යාන පාලන අංශය යන සෑම අංශයක් ම සම්බන්ධ කර ගනිමින් වඩාත් හොඳ සනීපාරක්ෂ පහසුකම් සිසුන්ට හා කාර්යය මණ්ඩලයට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

7 විදුලිය හා බලශක්තිය ඉතිරිකර ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය පහත ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

- ආලෝකය අවශ්‍ය ස්ථානය සඳහා සංයුක්ත ප්‍රතිදීප්ත විදුලි බුබුළු (CFL Bulb) පමණක් භාවිත කිරීමට කටයුතු කිරීම
- සූර්ය ශක්තිය මඟින් විදුලිය ලබා ගැනීමට යෝජනා ඉදිරිපත් කර ඇත
- ගොඩනැගිලි ඉදි කිරීමේදී ඇතුළට හිරුඑළිය ලැබෙන පරිදි වීදුරු ආවරණ සහිතව නිර්මාණය කිරීමට කටයුතු කර ඇත.

8 විශ්වවිද්‍යාලයේ සියලුම පාඨමාලා රැකියා අභිමුඛ පාඨමාලාවන් වන අතර සැමවිටම විරැකියාවට විසඳුමක් ලැබෙන ආකාරයේ පාඨමාලා අලුතින් ඇති කරමින් සමාලෝචනය කරමින් තිබෙන පාඨමාලා වැඩි දියුණු කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ. එසේ ම අලුතින් ඉංජිනේරු පීඨයක් ඇති කිරීමට බලාපොරොත්තු වන අතර එමඟින් රටේ ඉංජිනේරු ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රම දායකත්වය සැපයීමට බලාපොරොත්තු වේ.

9 තාක්ෂණ පීඨය විශ්වවිද්‍යාලයේ අලුතින් ආරම්භ කළ පීඨයක් වන අතර මෙමඟින් නවෝත්පාදන කටයුතු සඳහා වැඩි ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ. එසේ ම ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් විශ්වවිද්‍යාලය මඟින් සංවර්ධනය කරනු ලැබේ.

10 වයඹ විශ්වවිද්‍යාලයේ BREAD Center සහ BIC යන මධ්‍යස්ථාන මඟින් නවෝත්පාදන හා නව නිෂ්පාදන වෙනුවෙන් වන දිරිමත් කිරීම් කරන අතර නව නිෂ්පදන සඳහා අවශ්‍ය වන වෙළඳපළ හඳුන්වා දීමත් සිදුකරනු ලබයි.

එමඟින් ප්‍රදේශයේ අවට ප්‍රජාවට අවශ්‍ය තාක්ෂණික හා ව්‍යාපාරික දැනුම ලබා දීමට ද කටයුතු කරනු ලබයි.

11 විශ්වවිද්‍යාලය සතු සම්පත් උපරිම ඵලදායීතාවයකින් යුතුව භාවිතා කිරීමට කටයුතු කරනු ලබන අතර ඒ සඳහා පහත ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

- වෛද්‍ය පීඨයේ වරක් භාවිතා කළ ජලය පිරිසිදු කර නැවත භාවිතයට ගැනීම
- ඉවතලන ද්‍රව්‍ය දිරාපත්වන, වීදුරු, පොලිතීන් / ප්ලාස්ටික් සහ කඩදාසි වශයෙන් වෙන වෙන ම එකතුකර සුදුසු පරිදි අපහරණය කිරීම

12 විශ්වවිද්‍යාලය තම පරිශ්‍ර තුළ සැමවිටම හරිතකරණයට ලක් වූ පරිසරයක් පවත්වා ගැනීමට කටයුතු කරන අතර විශ්වවිදයාලයේ උද්‍යාන පාලන අංශ මඟින් රුක් රෝපණය කිරීම්, ඒවායේ ආරක්ෂාව සහ නඩත්තු සම්බන්ධයෙන් නිතරම සැලකිල්ලක් දක්වනු ලැබේ.

13 විශ්වවිද්‍යාලය තුළ විවිධ ජතීන්ට විවිධ ආගම්වලට අයත් ශිෂ්‍යයින් හා කාර්යය මණ්ඩලය සිටින අතර සෑම කටයුත්තකදී ම ජාතීන් අතර අන්‍යෝන්‍ය සුදහතාවය වර්ධනය වන අයුරින් විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ. ජනවාරි 01 දින සර්ව ආගමික වැඩසටහන් පැවැත්වීම, අනෙකුත් ආගමික උත්සවවල දී සියලුදෙනා එකතුව ඒවාට අදාළ සැරසිළි, වැඩසටහන් සිදුකිරීම මඟින් අන්‍යෝන්‍ය සුහදතාවය වර්ධනය වේ.

14 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව තුළ හා විදේශීයව ඇති අධ්‍යාපන ආයතන, මූල්‍ය ආයතන සහ අනෙකුත් විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් මඟින් සම්බන්ධතාවයන් පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. එය සිසුන්ට හා කාර්යය මණ්ඩලයට දෙස් විදෙස් සබඳතා ගොඩනගා ගැනීමට පිටුවහලක් වේ.

2020 වර්ෂයේ විගණකාධිපති

වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. NWP/KR/E/WUOSL/01/2020/FA/06

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2021 ජූලි 14 දින

උපකුලපති,
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂාකිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) විශ්වවිද්‍යාලයට ඉඩම් හා ගොඩනැගිලි සහ තොරතුරු තාක්ෂණ උපකරණ මිලට ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී මහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබූ රු. මිලියන 13.5 ක ප්‍රතිපාදන වර්ෂය අවසාන වන විටද අපේක්ෂිත කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයට ඉඩම් පවරා ගැනීම වෙනුවෙන් පන්නල හා කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පිළිවෙලින් 2013 හා 2016 වර්ෂවලදී එකතුව රු.17,513,750 ක් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම ඉඩම් පවරාගෙන නොතිබුණි.

(ඇ) වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ නේවාසිකාගාර සංකීර්ණයේ තොග විදුලි සැපයුම ලබාදීම සඳහා 2020 ජනවාරි 16 දින විදුලිබල මණ්ඩලය වෙත රු.4,293,155 ක් ගෙවා තිබුණද, වර්ෂය අවසාන වන විටත් එම කාර්ය නිම කර නොතිබුණි.

(ඈ) වසරකට වැඩි කාලයක සිට පැවතෙන සැපයුම් ණයහිමියන් තිදෙනෙකුට ගෙවිය යුතු එකතුව රු.11,062,012 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ඉ) "The assessment of water and sediment quality and associated sea urchin of the gulf of manner coastline" ව්‍යාපෘතිය සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් 2014 හා 2016 වර්ෂවල රු.3,437,160 ක් ලබාදී තිබුණද ඉන් රු.1,170,721 ක මුදලක් පමණක් වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර්

31 දින වන විටත් අදාල ව්‍යාපෘතිය නිමකර නොතිබූ අතර වසර 4 කට අධික කාලයක සිට රු.2,266,439 ක් ඌන උපයෝජිතව පැවතුණි.

(ඒ) කුලියාපිටිය හා මාකඳුර පරිශ්‍රයේ රු.41,825,013 ක් වැයකර ඉදිකරන ලද නිල නිවාස 4 ක් 2019 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2021 පෙබරවාරි 17 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

(ඓ) ඉදිකිරීම් ව්‍යාපෘති 22 කට අදාලව 2019 වර්ෂයේ ඉදිරිපත් කර තිබූ එකතු වටිනාකම රු.32,200,139ක් වූ බිල්පත් සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ගෙවීම් කර නොතිබුණි.

ඩබ්ලිව්.ජී.සී. වික්‍රමරත්න
විගණකාධිපති.

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය සහ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

2.3 වෙනත් කරුණු

(අ) ඉඩම් හා ගොඩනැගිලි වත්කම් මිලට ගැනීම.

2020 වර්ෂයේ දී මාකඳුර පරිශ්‍රය සඳහා ඉඩමක් මිලදී ගැනීමට ලංසු කැඳ වූ අතර ඒ සඳහා මිලියන 13.5 ක ලංසු පත්‍රයක් ලැබී තිබුණි. අදාළ ඉඩම මාකඳුර පරිශ්‍රය පුළුල් කිරීම සඳහා සුදුසු බැවින්, එහි වර්තමාන වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුවෙන් විමසන ලදුව එය රුපියල් මිලියන 12.5 ක් වටින බව විශ්වවිද්‍යාලය වෙත දැනුම් දී ඇත.

ඒ පිළිබඳව ඉඩම් හිමිකරු දැනුවත් කරන ලද අතර එම ඉඩම රුපියල් මිලියන 12.5 කට වයඹ විශ්වවිද්‍යාලය වෙත විකිණීම සඳහා කැමැත්ත ප්‍රකාශ කර ඇත. මෙම ඉඩම මිලදී ගැනීම සඳහා 2021.07.30 දින පැවති 219 වන පාලක සභාවේ අනුමැතිය ලැබී ඇති අතර කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමට නියමිත ය.

නොරතුරු තාක්ෂණ උපකරණ මිලට ගැනීම.

නොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය වෙතින් රුපියල් මිලියන 1 ක් සඳහා භාණ්ඩ ඉල්ලුම්පත්‍ර 2020 දෙසැම්බර් මාසයේ දී ලැබුණ අතර 2020 වසර තුළ සියලුම භාණ්ඩ සඳහා ඇණවුම්පත් නිකුත් කරන ලදී. අදාළ භාණ්ඩ සඳහා 2021 වසර මුල් භාගයේ ගෙවීමට කටයුතු කරන ලදී.

(ආ) වෛද්‍ය පීඨය පිහිටී ලබුයාය ඉඩම

ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට අනුව මෙම ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීම සඳහා කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් විසින් කුලියාපිටිය දිසා අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර එම නඩුව අවසන් වන තුරු මෙම ඉඩම අත්පත් කර ගැනීමට නොහැකි වී ඇත.

නඩු කටයුතු අවසන් වූ වහාම ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

මාකඳුර පරිශ්‍රයේ කුඹුරු ඉඩම්

මාකඳුර පරිශ්‍රය සඳහා කුඹුරු ඉඩම් 08 ක් මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ලෙස 2013.04.18 දින රු.1,013,750.00 ක මුදලක් වයඹ විශ්වවිද්‍යාලය විසින් ප්‍රාදේශීය ලේකම්/ පන්නල වෙත ගෙවා ඇත. එම පවරා ගැනීම ප්‍රාදේශීය ලේකම්, පන්නල විසින් සිදු කරමින් පවතී.

මෙම කුඹුරු ඉඩම් කඩිනමින් පවරා ගැනීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ අතුරු විධානයක් නිකුත් කිරීමට කටයුතු කරන ලෙස වයඹ විශ්වවිද්‍යාලය විසින් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත 2021.08.02 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත.

(ඇ) වෛද්‍ය පීඨයේ නේවාසිකාගාර සංකීර්ණයට නොගා විදුලි සැපයුම් ලබා දීමේ දී යෝජිත රැහැන් මාර්ගයට අවහිරව තිබූ ගස්/ කැලෑ ඉවත් කිරීමේ කාර්යය මේ වන විට සිදු කර ඇත. ඒ සඳහා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු රු. 455,025.00 ක මුදල 2021.08.15 දින ගෙවා ඇත. විදුලිබල මණ්ඩලය විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කොට විදුලි සැපයුම් ලබා දීම සඳහා වූ ගිවිසුම් අත්සන් කිරීම සඳහා විශ්වවිද්‍යාලය දැනුවත් කර ඇත.

ගිවිසුම් අත්සන් කිරීමට පෙර විදුලිබල මණ්ඩලයේ උපදෙස් පරිදි වෛද්‍ය පීඨ පරිශ්‍රය සහ නේවාසිකාගාර ඉඩම් යා වන පරිදි ප්‍රාදේශීය සභා මාර්ගයට ඉහළින් යොදා ඇති විදුලි රැහැන් ඉවත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

(ඈ) මෙම සැපයුම් ණයහිමියන්, නව ව්‍යවහාරික විද්‍යාපීඨ ගොඩනැගිල්ලෙහි වායු සම්කරණ පද්ධතිය සවිකිරීමේ කොන්ත්‍රාත්තුව සහ නඩත්තු අංශය සඳහා භාණ්ඩ මිලදී ගැනීම් වෙනුවෙන් ගෙවිය යුතු හිඟ මුදල් වේ. වර්තමානය වන විට මෙම සැපයුම් ණයහිමියන් වෙනුවෙන් ගෙවිය යුතු හිඟ මුදල් පියවීමට කටයුතු කරමින් පවතී.

(ඉ) පශු සම්පත් ඩිවර හා පෝෂණ පීඨයේ ජේ.ඒ.ඩී.එස්.එස්. ජයකොඩි මහත්මිය වෙත ප්‍රදානය කර ඇති මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු නැවත ආරම්භ කිරීම පිළිබඳව මුදල් කමිටුව වෙත ඉදිරිපත් කර තිබූ මුදල් කමිටු සංදේශ අංක 141.21 හා 142.17 පිළිබඳව සාකච්ඡා කිරීමෙන් පසුව නැවත වැඩ ආරම්භ කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය වෙතින් ලබා ගත් ලිඛිත එකඟතාවයක් පාලක සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා ලෙස මුදල් කමිටුව නිර්දේශ කර ඇත.

එයට අදාළ සංශෝධිත අයවැය සහ අනෙකුත් ලියවිලි 2021 ඔක්තෝබර් මස පැවති පාලක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

(ඊ) මාකඳුර පරිශ්‍රයේ ඉදිකර ඇති නිල නිවාස 2021.03.02 දින සිට අදාළ නිලධාරීන්ට බාර දීමට කටයුතු කර ඇත.

කුලියාපිටිය පරිශ්‍රයේ ඉදිකර ඇති නිල නිවාස අනුරින් ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ පීඨාධිපතිට වෙන් වූ නිල නිවාසය ඔහු විසින් භාර නොගන්නා බව දැන් වූ අතර එම නිල නිවාසය 2021.04.07 දින සිට ආචාර්ය කුමාර උළුවත්ත මහතාට හා ආචාර්ය කුමාර යාපා මහතාට ලබා දීමට කටයුතු කර ඇත.

(උ) විමසුමේ සඳහන් ව්‍යාපෘති 22 න් අංක 03 සහ 22 බිල්පත් (Construction of Faculty Building Stage II FAPM Makandura, Hostel Stage VI Makandura) සඳහා ගෙවීම් කර ඇති අතර බිල්පත් 05 ක් (අංක 06, 07, 08, 17, 18) නඩත්තු අංශය විසින් පරීක්ෂා කර බිල්පත් නිදහස් කිරීම සඳහා මූලධන අංශය මගින් කටයුතු කරමින් සිටී.

ඉතිරි බිල්පත් 15 නඩත්තු අංශය විසින් පරීක්ෂා කරමින් සිටින අතර කඩිනමින් ගෙවීම් කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

වෛද්‍ය පී.ජී.සී.එස්. බෝවත්ත
උපකුලපති

මැණික් බලපත ඵලපාදුරු
ශ්‍රී ලංකා ව්‍යාඝ්‍ර ඔක්ටෝපස්: ඉරය
කුලියාපිටිය